රතු තරුව
செந்தாரகை

සිංහල දෙමළ බසින් පළවන එකම සමාජවාදී පුවත්පත - එක්සත් සමාජවාදී පක්ෂයේ ප්‍රකාශනය

රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට මධුසමයක් නොමැත. 2
චීනයේ ආර්ථිකය තීරණාත්මක අර්බුදයක 6
75 වන TROTSKY සැමරුම 3
මහින්ද 58 ලක්ෂයෙන් මාකර්ට් කල හැකිද? 7
මැතිවරණ ප්‍රතිපල මතු කරන අභියෝග හඳුනාගැනීම 4,5

එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න ...
www.lankasocialist.com

2015 - සැප්තැම්බර් - 110 කලාපය - QD/162    පුවත්පතක් ලෙස මහ තැපැල් හලේ ලියාපදිංචි කරන ලදී    මිල රු. 20.00

# ජාතික ආණ්ඩුව කුමටද ?



# ජනතාව සීරුවෙන්

**අගෝස්තු 17 පැවැති ඡන්දයෙන් පසු මෙරට පාර්ලිමේන්තු ඉතිහාසයේ නොතිබූ අන්දමේ අපූරු සත්වයෙක් බිහිවී ඇත. එය නම් එජාප හා ශ්‍රීලනිපය සන්ධාන ගතව ප්‍රකාශයට පත්ව තිබෙන ජාතික ආණ්ඩුව සංකල්පයයි. බොහෝ යහපාලන පඬිවරු පවසන්නේ රට මුහුණ දී තිබෙන අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ප්‍රධාන ධනපති පක්ෂ දෙක ඒකාබද්ධ වූ ආණ්ඩුවක අවශ්‍ය තාවයක් තිබෙන බවය. මෙය බැලූ බැල්මට සාධාරණ කථාවක් බව තර්ක කළ හැකිය. එසේ වුවද ප්‍රධාන පක්ෂ දෙක හවුල් වී ගොඩ නගන ආණ්ඩුවෙන් අප රටේ දිළිඳු බාවය දුරු කර, විරැකියාවට පිළිතුරු දෙන, අධ්‍යාපනය හා සෞඛ්‍ය නගා සිටුවන කම්කරුවන්ට හා දුප්පත් ගොවි ජනතාවගේ අවශ්‍යතා සපුරාලිය නොහැකි ආණ්ඩුවකි. ඇත්ත වශයෙන් රනිල්ගේ මෙම සම්මුතිය ජනතා අයිතීන් සමතලා කරන සුපිරි ධනපති පංතියට අවශ්‍ය පරිසරය සකස් කර දීම සඳහාය. ඒ අනුව ජාත්‍යන්තර ප්‍රාග්ධනයට ඉඩ සලසාලීම සඳහා ජනතාවගේ සුබ සාධන අහෝසි කර දමනු ඇත.**

රටේ ප්‍රධාන ප්‍රශ්නය වන දෙමළ ජනතාවගේ ජාතික ප්‍රශ්නයට විසදාලීම සඳහා වැඩ පිළිවෙලක් ඉදිරිපත් කිරීමටද ජාතික ආණ්ඩුවට නොහැකිය. ඒ වෙනුවට ආරම්භයේදීම පෙනී යන්නේ හැන්ද තිබෙන අය බලය හා වරදාන බෙදා ගැනීම සඳහා තිබෙන අවලක්ෂණ බලු පොරයකි. එවන් පිරිසකගෙන් ආදර්ශමත් නායකත්වයක් බලාපොරොත්තු වීම ඉබ්බන්ගෙන් පිහාටු බලාපොරොත්තු වීම වැනිය. යහපාලන බෝඩ් ලැල්ලට යටින් අධිරාජ්‍යවාදී ගෝලීය බලවතුන් විසින් මෙහෙයවන රාජ්‍ය ප්‍රතිපත්තිය සමග නව ලිබරල් ආර්ථික ක්‍රියාදාමය බදාවකින් තොරව ගෙන යාමට ප්‍රධාන ධනපති පක්ෂ දෙක අතර ගිවිසුම් ගසා ගෙන ඇත. මේ තුලින් සාමාන්‍ය ජනතාවට ඇතිවිය හැකි භයානක ප්‍රතිපල තේරුම් ගැනීමට ජනතාවට කාලයක් ගත විය හැකිය. කම්කරු පංතිය ප්‍රමුඛ ප්‍රගතිශීලි බලවේග මෙම අනතුර නිවැරදිව හඳුනා ගෙන පීඩිත පංතියට නායකත්වය දීම සඳහා බල මුලු ගැන්විය යුතුව ඇත. ඒ සඳහා කට්ටිවාදී හා අතිවාමවාදී රෝග දුරුකර ක්‍රියාකාරී වමේ එක්සත් බල කඳවුරක් ගොඩ නැගීමට එක්සත් සමාජවාදී පක්ෂය පෙරමුණ ගැනීමට කටයුතු කරනු ඇත.

# ජාත්‍යන්තර පරීක්ෂණය ගැන දෙමළ සන්ධානය තුළ මත බේද?

යුද්ධය අවසන් වකවානුවේදී සිදුව ඇතැයි සැලකෙන යුද්ධ අපරාධ පිළිබඳ සොයා බැලීමට ජාත්‍යන්තර පරීක්ෂණයක අවශ්‍ය බවට ඇමරිකා එක්සත් ජනපදය පසුගිය කාළයේදී ගෙනෙන ලද යෝජනාව දෙමළ ජාතික සන්ධාන (TNA) එකහෙලා අනුමත කරන ලදී. එසේ වුවද අගෝස්තු 17 මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීම සමග ඇමරිකාව මුලින් දැරූ අදහස වෙනස් කර ගෙන තිබීම නිසා දෙමළ සන්ධානය අර්බුදයට ගොස් ඇත.

නොබෝදා ලංකාවට පැමිණි ඇමරිකානු ආණ්ඩුවේ දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම් නිෂා බිස්වාල් ප්‍රකාශ කළේ අභ්‍යන්තර පරීක්ෂණයක් ආරම්භ කිරීමට ඇමරිකාව පූර්ණ සහයෝගය දෙන බවයි. පෙර සුදානම් කර නොතිබූ සංචාරයක් සඳහා බිස්වාල් හදිසියේ මෙහි පැමිණියේ ජාත්‍යන්තර පරීක්ෂණය යට ගැසීමට බව ඉතා පැහැදිලිය.

මේ සමග දෙමළ දේශපාලන පක්ෂ අභ්‍යන්තරයේ විශාල මතබේද හට ගෙන ඇත. ඊට හේතු වී ඇත්තේ දෙමළ ජාතික සන්ධානයේ ධනපති නායකත්වය රනිල් - මෛත්‍රී ආණ්ඩුවේ උවමනාව මත යුද්ධ අපරාධ සිදුවීම් පිළිබඳ කාරනය යට ගැසීමට උපකාර කරන තැනකට පත්වීමය. උතුරේ ජනතාවට බොරු පොරොන්දු දී උතුරේ බලය දිනා ගත් දෙමළ සන්ධානයන ක්‍රමානුකූලව එකී ජනතාවගේ උවමනාවෙන් ඉවත්ව දකුණේ ආණ්ඩු සමග සම්මුති ගසන තත්වයකට පත්ව ඇති බව පැහැදිලිය. මෙම තත්වය තුළ මේ වන විටත් සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් හා සිවාපිලිංගම් යන දෙමළ නායකයින් සමග උතුරු පළාත් සභාවේ මහ ඇමති විග්නේෂ්වරන්ද දේශිය පරීක්ෂණය අපරාධ යට ගැසීමට කරණ බොරු පරීක්ෂණයක් බවත් ජාත්‍යන්තර පරීක්ෂනයකින් යුද්ධ අපරාධ සිදුවූයේ ද යන්න පරීක්ෂණය කළ යුතු බව තරයේ ප්‍රකාශ කර සිටී.

## අවනඩුව

**යහපාලනය නම් තාමත් දුර ඈතයි**
**ජාතික ආණ්ඩුව පණ ගහනවා යන්තම්**
**මාස 60න් අලුත් රටක් හදනවලු**
**මග නොවැරදී යන්නට හැකි වෙයිද සැකයි.**

**රාජපක්ෂ ලොකු සීයා අනේ අපොයි**
**ගෝල බාලයනුත් දැන් නම් හරිම හිඟයි**
**ඇතුගල මුදුනින් පහළට රූටාලා**
**අලියා ගහල දැන් හොඳටම අසාධ්‍යයි...**

**ධනවාදයට හා ජාතිවාදයට එරෙහි වමේ බලයක් කරා පෙරට ....**

රතු තරුව
සෙන්තාරගෛ

53/6 ඊ.ඩී.දාබරේ මාවත, කොළඹ 05.
E.mail – unitedsocialists@gmail.com
Tel – 4510289 / 2504647
එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.lankasocialist.com

# රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට මධුසමයක් නොමැත.

සාමාන්‍යයෙන් මැතිවරණ ජයග්‍රහණයකින් පසුව බලයට පත් වන හැම ආණ්ඩුවකටම පාහේ මධුසමය කාලයක් ඇතැයි කියනු ලැබේ. මැතිවරණ ජයග්‍රහණය පිළිබඳව උදම් අනමින් වහසි බස් දොඩමින්, උත්සව පවත්වමින් අඩු තරමින් මාසයක දෙකක හෝ මධුසමයක් ගත කිරීමට නව පාලකයෝ යොමු වෙති. අපේ රටේ ද බොහෝ මැතිවරණ වලින් ජයගත් පක්ෂ මුල්සති - මාස කිපය ගත කළේ උත්සව ශ්‍රීයෙනි.

එහෙත් මෙවර මැතිවරණයෙන් බලයට පත් වූ අගමැති රනිල් වික්‍රමසිංහගේ රජයට එවැනි මධුසමයක් ගත කිරීමට කාලයක් නැත. එය හුදෙක් පාර්ලිමේන්තුවේ බහුතර බලයක් දිනා ගැනීමට එක්සත් ජාතික පක්ෂයට නොහැකි වීම නිසා නොවේ. අවශ්‍ය නම් ඔහුට ලෙහෙසියෙන්ම 113 කඩුල්ල ජය ගත හැකිය. තුනෙන් දෙකක පාර්ලිමේන්තු බලයක් ලබා ගත්තේ වුවද අගමැතිවරයා මුහුණ දෙන පළමු අභියෝගය මේ මාසය තුළ දීම ඉස්මතු වෙයි. උතුරේ යුද්ධයේ අවසන් කාලයේ සිදු වු යුධ අපරාධ සහ වෙනත් මානව හිමිකම් කඩ කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ වාර්තාව මේ මාසය මැද දී නිකුත් වීමට නියමිතය. අගමැතිවරයාට හෝ ඔහුගේ රජයේ කිසිවෙකුට එයින් බලපෑමක් නැතත්, මහින්ද, ගෝඨාභය ප්‍රමුඛව ආරක්ෂක හමුදා වල ප්‍රධානීන් රැසක් (ඇතැම් විට සරත් ෆොන්සේකා ද ඇතුලුව) වගකීමට යටත් කරනු ලැබිය හැකිය.

යුධ අපරාධ පිළිබඳ වගවීම සහතික කරනු පිණිස දේශිය යාන්ත්‍රණයක් අති කරන බවට ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් බොහෝවාර ගණනක් පවසා ඇත. දැන් ආණ්ඩු බලය ලැබී ඇති හෙයින් එකී යාන්ත්‍රණය ඇති කිරීමට දැන් රජයට සිදුවේ. එය අතුරේ ගමන් කරන්නාක් මෙන් පරිස්සමින් කල යුතු වැඩකි. එක අතකට නව රජය කෙරෙහි විස්වාසය තබා ඇති ධනේශ්වර ලෝක ප්‍රජාව සෑහීමකට පත් කළ යුතු අතර රාජපක්ෂ කල්ලිය සහ බෞද්ධ භික්ෂූන් විසින් දල්වනු ලැබිය හැකි ජාතිවාදී ගිනි පුපුරුවලින් බේරී සිටීමටද රනිල් වික්‍රමසිංහට සිදුවේ.

රටේ අර්ථිකයද තිරණාත්මක සහ දුෂ්කර තැනකට පත්ව ඇත. ජනවාරි 8 දා ජනාධිපතිවරණයෙන් පසු බලයට පත් දින 100යේ ආණ්ඩුව සුලුතර සහ තාවකාලික රජයක් වූ අතර එහෙයින්ම එය ස්ථාවර රජයක් වූයේද නැත. රාජපක්ෂ පාලනය විසින් කාබාසිනියා කරන ලද තත්වයක් තුළ ආර්ථිකය සාමාන්‍ය මට්ටමකින් පවත්වා ගෙන යාම තබා රජයේ සේවකයන්ගේ වැටුප් ගෙවීම පවා ප්‍රශ්නගත තත්වයකට පත්විය. අදායම් උපයා ගැනීම සඳහා ජනවාරි 29 අයවැයෙන් යෝජනා කරන ලද මන්දිර බද්ද, සුපිරිවාසී බද්ද ඇතුලු කිසිදු යෝජනාවක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගැනීමට එම රජය ක්‍රියා කලේ නැත. පසුගිය මාස හයක කාලයේදී රජයේ ආදායම සීඝ්‍ර ලෙස පහත වැටී ඇති අතර වියදම් එවැනි සීඝ්‍රතාවකින් ඉහල නැග ඇත.

දළ විදේශිය සංචිතය ජුනි මාසයේ ඩොලර් බිලියන 7.5ක මට්ටමේ සිට ජුලි අවසානය වන විට ඩොලර් බිලියන 6.9 දක්වා පහත වැටී ඇත. භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර හරහා ලබා ගන්නා ලද දේශීය ණය ප්‍රමාණය මේ වසරේ මුල් මාස හය තුළදී රු.661ක් විය. 2014 මුලු වසරටම එසේ ලබා ගෙන ඇත්තේ රු. බිලියන 445 කි. මේ අනුව නොවැම්බර් මාසයට නියමිත අයවැය ඉදිරිපත් කිරීම රනිල්ට අතිශය දුෂ්කර කටයුත්තක් වනු ඇත. ධනේශ්වර සීමාවන් තුළ රජයට ඉතිරි වී ඇති එකම ක්‍රියාමාර්ගයන් වනුයේ විදේශිය ණය ගැනීම් සහ ජනතාව භුක්ති විඳින සීමිත සුභ සාධන ටිකත් කප්පාදු කිරීමය.

දූෂණය පිටු දැකීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීමත්, පහුගිය පාලනයේ දූෂිතයන්ට එරෙහිව පියවර ගැනීමත් එවැනිම බරපතල අභියෝගයකි. ජනාධිපතිවරණයේ පසු ගෙවී ගිය කාලයේ වැඩිපුර දක්නට ලැබුණේ දූෂණ විරෝධී කතා මිස ක්‍රියා නොවේ. දැන් වැඩට බහින්නට කාලය පැමිණ ඇත. කිසිදු නෛතික - පාර්ලිමේන්තු හෝ වෙනත් බාධාවක් නොමැත. වැඩිකල් නොයා රාජපක්ෂ පාලනයේ මහ හොරුන් සිපිරි ගෙට යනු දැකීම ජනතා අපේක්ෂාවයි. පහුගිය මාස කිපයේ සිදුවූ අයුරු මේ දූෂිතයන් හිර ගෙදර රජ සැප විඳීම නම් දැන් ජනයා කිසිසේත් අනුමත නොකරන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මෙයට අමතරව තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත සහ ජාතික විගණන පනත සම්මත කිරීම රජයේ ප්‍රමුඛ කාර්යයක් විය යුතුය. පොරොන්දු වූ යහපාලනය යාන්තමින් හෝ ඇති කිරීම සඳහා මේ නීති අත්‍යවශ්‍ය වේ. මැති ඇමතිවරුන් රජයේ - එනම් මහජන මුදල් තම බූදලය සේ සලකා වියදම් කිරීම පැවැත්වීමටත්, ඒ පිළිබඳ හැබෑ තොරතුරු දැන ගැනීමටත් මේ නීති අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත් එජාපය ප්‍රමුඛ රජයකින් ජනතාවට බලාපොරොත්තු විය හැකි දෙයක් නැති තරම්ය. ආරම්භයේදී යම් යම් සහන පියවරයන් කිපයකට එළඹිය හැකි නමුදු දේශීය මෙන්ම ජාත්‍යන්තර ධනපති පන්තියේ ඕනෑ එපාකම් වලට ගැලපෙන රටක් ගොඩ නැගීම රනිල් වික්‍රමසිංහගේ අපේක්ෂාවයි. මාස 60කින් අලුත් රටක් යන ඔහුගේ තේමා පාඨයෙහි ඇත්ත අර්ථය එයයි. එබැවින් එය අනිවාර්යයෙන්ම කම්කරු පන්තිය සහ අනෙකුත් පීඩිත ජන කොටස් සමග ගැටුමකට යාම වැළැක්විය නොහැකි වනු ඇත. රාජපක්ෂ සමයේ හීලෑ කරන ලද සෙයක් පෙන්නුම් කරන කම්කරු පන්ති ව්‍යාපාරය තමාට නතු කර ගත හෝ පාලනය කර ගත හැකි වනු ඇතැයි රනිල් බලාපොරොත්තු වන බව පෙනේ. සටන්කාමී යයි කියා ගත් වෘත්තීය සමිති නායකයින් පිරිසක් රනිල් වික්‍රමසිංහ පසුපස යාම මෙයට එක හේතුවකි.

මේ තත්වය තුළ කම්කරු පන්තිය සහ වැඩ කරන ජනයා සූදානම් ශරීරයෙන් සිටිය යුතු බව අමුතුවෙන් කිවයුතු නැත. පන්ති ව්‍යාපාරයේ නායකත්වය දුර්වලව සහ සී සී කඩව පවතින, එමෙන්ම කිසිදු ඉදිරි දැක්මකින් තොරව ඉඹාගාතේ ඇවිදින සෙයක් පෙන්නුම් කරන මේ මොහොතේ පාලකයන් පන්තිය පාලනය කිරීමට හොඳම අවස්ථාව මෙය බව සලකා ක්‍රියා කරන්නට බැරි නැත. ඊනියා ජාතික ආණ්ඩුවක වැඩිම අනතුර ඇත්තේ එතැනය. එබැවින් වෘත්තිය සමිති නායකයින්ගේ පටු කට්ටිවාදී අදහස් පරාජය කර කම්කරු පංතියේ එක්සත් කමක් ගොඩනැගීමට වහා පියවර ගත යුතුබව අපි අවධාරණය කර සිටිමු.

# අලුත් වටයකින් ඉස්මතු වන ජාතික ප්‍රශ්නය



අපේ රටේ දේශපාලනයෙහි තිරණාත්මක - කේන්ද්‍රිය ප්‍රශ්නය ජාතික ප්‍රශ්නය බවට විවාදයක් නැත. 1994 සිට 2005 දක්වාම පැවති මැතිවරණ වලදී ද එසේ තිරණාත්මක සාධකයක් විය. දැඩි යුධ විරෝධී ජනමතයක් පැවති 1994 දී චන්ද්‍රිකා කුමාරතුංග බලයට පැමිණියේ සාමයේ පරවි ධේනුවක ලෙසිනි. කෙමෙන් ජාතිවාදය දෙසට නැඹුරු වු ඇය රනිල් වික්‍රමසිංහ කොටි සංවිධානය සමග හොර ගිවිසුම් ගසනවාය කියමිනි 1999 සිට මැතිවරණ මෙහෙය වූයේ. ඒ ජාතිවාදී ප්‍රචාරයන්ට එරෙහිව 2001 දී අගමැති ධූරයට පත් වූ රනිල් වික්‍රමසිංහ 2002 දී කොටි සංවිධානය සමග සටන් විරාම ගිවිසුමකට එළඹීම ජාතික ප්‍රශ්නය සන්නද්ධ අරගලයක් දෙසට යොමු වු පසු එළඹි ඉතාම වැදගත් සංසිද්ධිය ලෙස හැඳින්විය හැකිය.

කෙසේ වෙතත් සටන් විරාම ගිවිසුම අසාර්ථක වීමෙන් පසු ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ සහයෝගය ඇතිව 2004 දී චන්ද්‍රිකාත් 2005 දී මහින්ද රාජපක්ෂාත් දැඩි දෙමළ විරෝධී ජාතිවාදී ස්ථාවරයක් කරා යොමු වූ අතර මහින්ද නැවතත් ඒකීය රාජ්‍යය කරලියට නැංවීම හරහා දෙමල ජනයා ශ්‍රී ලංකා රාජ්‍යය තුළ පිටස්තරයන් බවට පත් කිරීමේ තත්වයකට යොමු විය. 2006 වසරේදී LTTE සංවිධානය මාවිල් ආරු සොරොව්ව වැසීම යුද්ධයට අතවනමින් සිටි රාජපක්ෂගේ ඇහැට ඇඟිල්ලෙන් ඇනීමක් බඳු විය. කුමන විනාශයක් සිදු කොට ගෙන යුද්ධය ජය ගැනීමේ ඒකායන අරමුණින් ක්‍රියා කළ රාජපක්ෂ ජනාධිපතිවරයා 2007 සිට 2009 දක්වා ගෙන ගිය දැවැන්ත ප්‍රහාරයකින් පසු 2009 දී ප්‍රභාකරන් ද මරා දමා කොටි සංවිධානය පරාජය කළේය. මේ සමස්ථ සංහාරයටම ජනතා විමුක්ති පෙරමුණ එකසිතින් සහය දුන් බව නැවත සඳහන් කළ යුතුය. වඩාත් ප්‍රබල අවි බලය සහ වැඩි මිනිස් බලයද සමග රට පුරා දැඩි යුධවාදී මානසිකත්වයක් ඇවිලවීම මේ ජයග්‍රහණයේ පදනම විය.

රාජපක්ෂ ප්‍රමුඛ සමස්ත ජාතිකවාදී කඳවුර සිතා සිටියේ සුපිරි සන්නද්ධ බලයෙන් යුද්ධය ජය ගත් පසු ප්‍රශ්නය අවසන් බවය. සිංහල, දෙමල, මුස්ලිම් ආදී වශයෙන් ජාතීන් තවදුරටත් නැති බවත්, දැන් රටේ සිටින්නේ ජාතීන් දෙකක් පමණක් බවත් ඒ නම් රටට ආදරය කරන ජාතිය සහ රටට ආදරය නොකරන - රට පාවා දෙන ජාතිය බවත් ඔහු යුධ ජයග්‍රහණයෙන් අනතුරුව කිව්වේ ඒ අනුවය. පාරවල් හැදීමෙන් ගොඩනැගිලි හැදීමෙන් දෙමළ ජනයා තමන් වෙතට දිනාගත හැකියයි ඔහු ඉතා අඳබාල ලෙස විස්වාස කළේය. 2009 දී යුධ ජයග්‍රහණයත්, 2010 දී ලද දැවැන්ත ජනාධිපතිවරණයත් සමග මහින්ද රාජපක්ෂ හිතා හිටියේ තම පාලන කාලය මධු සමයක් - සැණකෙළියක් වනු ඇති බවටය. එසේ වුවද යුද්ධයේ අවසාන කාලයේ සිදු වූ - එහෙත් රටේ ජනතාවගෙන් වසන් කළ දැවැන්ත සංහාරය ජාත්‍යන්තර තලයේ රැව් දෙන්නට විය. සිංහලයන් පාරට බස්සා බොරු ජාති - ආල පෙළපාලි පැවැත් වුවද මේ සංහාරයට එරෙහිව ගොනු වන ලෝක මතය යටපත් කළ නොහැකි විය.

ජාතික ප්‍රශ්නයේ වත්මන් මුහුණුවර ඉස්මතු වන්නේ මේ සන්දර්භය තුළය. එවකට සිදු වී යයි කියන යුධ අපරාධ පිළිබඳ මානව හිමිකම් මණ්ඩලයේ විශේෂ පරීක්ෂණ වාර්තාව ඉදිරි දින කීපය තුළ දී එළිදැක්වීමට නියමිතය. ඒ පිළිබඳ වගවීමේ ක්‍රියාවලියක් දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් ඉදිරියේදී උද්ගත වනු ඇත. රටක ජාතික ප්‍රශ්නයක් උද්ගත වනුයේ එහි ජාතීන් දෙකක් හෝ වැඩි ගණනක් ජිවත් වන විටය. සමාජවාදීන් වන අප පිළිගන්නේ මේ රටේ සිංහල සහ දෙමළ යන ජාතීන් දෙකක් ජිවත් වන බවයි. වමේ වෙස් පැළැඳගත් ජවිපෙ මෙන්ම එයින් බිඳිගිය පෙරටුගාමීන්ද දෙමළ ජනයා ජාතියක් වශයෙන් පිලි ගන්නේ නැත. ඔවුන් දෙමළ ජනයාගේ ජාතිකත්වය අඩු මට්ටමට පහත හෙළයි. කිසිදු හැබෑ අර්ථයක් නැති සම අයිතිය ලබා දීමෙන් ජාතික ප්‍රශ්නය විසඳිය හැකියයි ඔවුහු හිස් වචන ප්‍රකාශ කරති.

ක්‍රියාවෙන් කිසි දෙයක් නොකළද රාජපක්ෂ පාලන සමයේ නිතර භාවිතා වු වචන දෙකක් විය. ඒවා නම් සංහිඳියාව සහ ප්‍රතිසන්ධානයයි. reconcillation යන ඉංග්‍රීසි වචනය සඳහා යොදාගත් පර්යාය පද දෙකත් ඒ ඒවා අර්ථවත් කිරීම සඳහා වන කිසිදු යථාර්ථවාදී පියවරක් ගැනීමට රාජපක්ෂ රජය ක්‍රියා කලේ නැත. ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීමටත් ත්‍රස්තවාදය නැවත ඇති නොවීමටත් නම් ජාතික ප්‍රශ්නය හරි හැටි හඳුනා ගෙන අවශ්‍ය විසඳුම් ලබාදිය යුතුය.

මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිවරයා පසුගිය ජනාධිපතිවරණ සමයේ සිටම දෙමළ ජනයා කෙරෙහි බොහෝ ලෙන්ගතු අයුරින් කතා කරනු අපි දුටුවෙමු. මෑතකදී සාම්පූර්හි වසර 10ක් තිස්සේ අවතැන්ව සිටි සහ රාජපක්ෂ පාලනය විසින් නැවත පදිංචි කිරීම හිතාමතාම ප්‍රතික්ෂේප කර සිටි දෙමළ ජනයාට තම මුල්ගම්බිම් වල නැවත පදිංචි කිරීම සඳහා හිමිකම් සහතික බෙදාදීමද සිරිසේන විසින් සිදු කරන ලදී. ඔහු ඒ සඳහා සහභාගී වූයේ දෙමළ ජාතික සන්ධානයේ නායක සම්බන්ධන් මන්ත්‍රිවරයාගේ ආරාධනයක් මත යයිද වාර්තා විය. මේ අයුරින් රජය හැකිතාක් දෙමළ ජනයා වෙත මිත්‍රත්වයේ හස්තය දිගු කරන බවත් ඇඟවෙන අතර දෙමළ ජනයා බලා සිටින්නේ රජය ඒ සම්බන්ධයෙන් ගන්නා සංයුක්ත පියවර කුමක්ද යන්නයි. පාර්ලිමේන්තු මැතිවරණයේදී වැඩිම ආසන ගණනක් දිනූ එක්සත් ජාතික පක්ෂය ප්‍රකාශ කලේ ඒකීය රාජ්‍යයක් තුළ උපරිම බලය බෙදීමක් සිදු කරන බවත් 13 වැනි සංශෝධනය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන බවත්ය.

7 පිටුවට......





# 75 වන TROTSKY සැමරුම

**මීට වසර 75 කට පෙර එම යුගයේ සිටී ඉතාම ශ්‍රේෂ්ඨ විප්ලවවාදියෙකු වූ ලියෝන් ට්‍රොට්ස්කි ඝාතනය කරනු ලැබුවේ රාමොන් මර්කේඩර් නම් වූ ජෝෂප් ස්ටාලින්ගේ කුලී මිනීමරුවෙකු විසිනි. ඊට පෙරදීද ට්‍රොට්ස්කි ඝාතනය කිරීමට කීපවාරයක්ම ඔවුන් තැත් කල නමුදු එය ව්‍යර්ථ විය. නමුත් මෙම වතාවේදී හිම කඩන පොරෝවකින් එල්ල කල මාරාන්තික පහරකින් වැඩ කරන ජනතාවගේ මස්තිෂ්කය වූ එමෙන්ම ස්ටාලින්ගේ ඒකාධිපතීත්වයට හා ධනවාදයට අනුකම්පා රහිත ලෙස පලකරනු ලබන විරෝධයේ සංකේතයක් වූ ට්‍රොට්ස්කි විනාශ කරනු ලැබිණ. මෙම සිද්ධිය ක්‍රෙම්ලිනයේ ස්ටාලින් ප්‍රමුඛ ප්‍රභූ නිලධාරීවාදී පිරිස ප්‍රීතියෙන් සමරද්දී ඔවුන් සමග යුරෝපයේ ඇමරිකාවේ මෙන්ම ලෝකයේ වෙනත් රටවල ධනවාදී රජයන්ද ප්‍රීතියෙන් උද්දාම වුහ.**

## ට්‍රොට්ස්කගේ ලේඛණ සාහිත්‍යය විනාශ කිරීම

මෑතකදී පල කරනු ලැබූ චරිතාපදානයක් තුලින් ට්‍රොට්ස්කිගේ සාහිත්‍ය ඝාතනය කිරීමට රොබට් සර්විස් නම් ලේඛකයෙකු යත්න දරා ඇත්තේ නවතම පියවරක් ලෙසිනි. එය දේශපාලනික හා සාහිත්‍යමය වශයෙන් ඉටුකර ඇත. අපකීර්තියට පත් මොස්කව් නඩු විභාග සිදුවන කාලයේදී බ්‍රිතාන්‍යයේ එවකට සිටි රුසියානු තානාපතිවරයාට වින්ස්ටන් චර්මිල් කියූ වදන් මාලාව ඔහු යලිත් අවධාරණය කරයි. මම සෑහෙන කලක සිටම ඔහුගේ ක්‍රියාවන් පිලිබඳව විමසිලිමත්ව සිටියෙමි. ඔහු රුසියාවේ දුෂ්ටතම ප්‍රබුද්ධයාය. ස්ටාලින්ට ඔහු හා අරගල කිරීමට හැකිවීම ඉතා හොඳ තත්වයකි. ඇත්ත වශයෙන්ම ට්‍රොට්ස්කි ඝාතනයට පදනම වැටුනේ අපකීර්තිමත් මොස්කව් නඩුවිභාග තුලිනි.

ට්‍රොට්ස්කි ඝාතනය කිරීමෙන් ඔහු දැරූ අදහස්ද විනාශ කල හැකියයි ඔවුන් සිතුවේ නම් එය අතිශය මුලාවකි. ඊලඟ පරම්පරාවන් බොහෝවිට දේශපාලනික දැනුමෙන් පොහොසත්වූ පිරිස් ධනවාදයට හා ස්ටාලින්වාදයට එරෙහිව අරගල කිරීමට පිවිසෙද්දී ඔවුන් පරිහරණය කලේද අවශ්‍ය ආහාෂය හා කරුණු පැහැදිලි කර ගැනීම් ආදිය ලබා ගත්තේද ට්‍රොට්සකිගේ කෘතින් පරිශීලනය කිරීමෙනි. 1989 පසු සෝවියට් දේශය බිඳවැටීම සිදුවූ මතවාදී ප්‍රතිවිප්ලව සමය තුලද ට්‍රොට්ස්කිගේ අදහස් තවමත් ආකර්ශනීය බව ඔප්පු විය. 1930න් සමග සිදුව ඇති ඉතාම දරුණු ධනවාදී ආර්ථික අර්බුදය හමුවේ එහි ප්‍රතිපලයක් ලෙස වැඩ කරන ජනතාව මෙන්ම දිලිඳු ජනතාව අතරින් අනිවාර්යයෙන්ම ජනතා කැරැල්ලක් ඇති වුවහොත් ඒ සඳහා ට්‍රොට්ස්කිගේ අදහස් කෙතරම් දුරට බලපානු ඇද්ද යන්න ගැන ධනවාදී න්‍යායවාදීහු බිය පල කරති. ජනතා කැරැල්ලක් මතුවන යුගයකදී නිලධාරීවාදයට එරෙහිව සමාජවාදය හා ජාතික විමුක්තිය වෙනුවෙන් සටන් කල චේ ගෙවාරා වැනි වීරයින්ද ලියෝන් ට්‍රොට්ස්කි වැනි මතධාරීන්ද ජනතාව ආදර්ශයට ගන්නා බව මෙම න්‍යායවාදීහු හොඳින්ම නැතිනම් තරමක් හෝ හොඳින් දැන සිටිති. නව පරම්පරාවට එම මාවත වසා දැමීම සඳහා ට්‍රොට්ස්කි අවමානයට පත් කරන යම් ව්‍යාපාරයක් අත්‍යවශ්‍යවෙයි. රොබට් සර්විස් විසින් ලියන ලද ග්‍රන්ථය මෙන්ම පසුගිය වසරේ එළිදුටු එවැනි වූ ග්‍රන්ථ මෙම අවශ්‍යතාවය ඉටු කරයි.

ට්‍රොට්ස්කිගේ අදහස් ඇත්ත වශයෙන්ම බොල්ෂේවික්වාදයේම අංකුරයක්වූ බවත් බොල්ෂේවික්වාදය උරුමයෙන්ම අධිපතිවාදී හා ආඥාදායක ස්වරූපයක් ගන්නා බවත් රොබට් සර්විස් කියයි. මෙය නියත වශයෙන්ම ලෙනින් නායකත්වය දුන් බොල්ෂේවික් පක්ෂයට කරන ද්වේශ සහගත අපහාසයකි. බොල්ෂෙවික් පක්ෂය යනු මානව ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම එකම එක සිද්ධියක් ලෙස අනන්‍ය වන රුසියානු විප්ලවය මෙහෙයවන ලද වැඩ කරන ජනතාවගේ ඓතිහාසික ඉතාමත්ම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයයි. බොල්ෂේවික් පක්ෂය පිසදා හරිමින් සිය අධිපතිවාදී ක්‍රමවේද උපයෝගී කරගත් ස්ටාලින්වාදය බොල්ෂේවික්වාදය අඛණ්ඩව පවත්වාගෙන යනවා වෙනුවට එය නිෂ්ක්‍රිය කිරීමට කටයුතු කළේය.

1930 වර්ෂයෙන් පසුව මෙන්ම 1945 වර්ෂය නිමවනවාත් සමග ඇතිවූ කාලයේදී ස්ටාලින්වාදය විසින් සිදුකල අපරාධ ගැන බොහෝ සෙයින් කරුණු නොදන්නා නව පරම්පරාව අරගලවලට එළඹුනු විට ස්ටාලින්වාදය යම් තරමකට ආකර්ශණයක් සහිත විය. නමුත් අද එවැනි ආකර්ශනයක් නොමැත. අද තත්වය ඉදුරා වෙනස්ය. එහෙයින් ධනවාදය පුපුරා හැලෙන මෙම යුගයේදී ට්‍රොට්ස්කිගේ ක්‍රමවේද හා ඔහුගේ විශ්ලේෂණ හා ප්‍රජාතන්ත්‍රවාදයේ සැබෑ ස්වරූපය සඳහා කම්කරුවන් කරනු ලබන අරගලය ඉදිරියට ගෙනයාමට මහත් රුකුලක් වෙයි. එය ස්ටැලින්වාදය ගැන අවශ්‍යයෙන්ම දැනගතයුතු කරුණු පමණක් නොව අද පවත්නා වැඩකරන ජනතාවගේ සාමාන්‍ය අරගලයන් පිළිබඳව කරුණු කියාදෙයි. මෙමගින් අදහස් වන්නේ මාක්ස් එංගල්ස් හා ලෙනින් මෙන්ම ට්‍රොට්ස්කිද සර්ව සම්පූර්ණ කිසිවිටෙකත් වැරදීමක් සිදු නොවන පුද්ගලයෙකු යන්න නොවේ. 1930 ගණන්වලදී පැසිස්ට්වාදය සියුම් ලෙස විග්‍රහ කරමින් පතුරු ගසමින් ඔහුගෙන් ඉටුවූ අප්‍රමාණ දායකත්වයට එයට සාක්ෂි සපයයි. 1920 ගණන්වලදී පැසිස්ට්වාදය නව්‍යතම සංසිද්ධියක්වූ විට ඔහු පලකල අදහස් විවෘත ලෙසම නිවැරදි කිරීමට එවකට වුවද ඔහු සූදානම්ව සිටියේය. ඒ කාලය තුලදී ස්පාඤ්ඤයේ ප්‍රීමෝ ඩී රිවේරාගේ පාලනය වැනි ඒකාධිපති ආණ්ඩු ප්‍රබල ලෙස පැසිස්ට්වාදී ලෙස හඳුන්වාදීමට ට්‍රොට්ස්කි පවා යොමුවී සිටියේය. පසුව එසේ හැඳින්වීම වැරදි සහගත බව හඳුනාගැනීමෙන් පසුව පැසිස්ට්වාදය යනු කුමක්ද යන්නට ඊට වඩා නිවැරදි නිශ්චිත නිර්වචනයක් ඔහු ඉදිරිපත් කළේය. කම්කරුවන්ගේ සංවිධාන අඩපණ කරන පැසිස්ට්වාදය යුදමය බොනපාට්වාදී ආණ්ඩුවලින් වෙනස්වන අයුරු පැහැදිලි කළේය. යුදමය බොනපාට්වාදී ආණ්ඩු ප්‍රතිගාමී වුවද සියළුම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හා සංවිධාන සහමුලින්ම විනාශ කර දැමීමට සමත් නොවන බවද ඔහු වටහා දුන්නේය.

## ට්‍රොට්ස්කිගේ අදහස් යල්පැනූ ඒවා නොවේ

ට්‍රොට්ස්කිගේ අදහස් අද යල්පැන ගොස් ඇතැයි තර්ක ඉදිරිපත්වේ. ඔවුන් සියල්ලන්ම වර්තමාන ධනේෂ්වර පද්ධතිය ආරක්ෂා කරන්නවුන්ගේද මතය හා සම්බන්දය. ඇත්ත වශයෙන්ම ට්‍රොට්ස්කිවාදය යනු මාක්ස්ගේ අදහස් නූතන යුගයේදී පැහැදිලි ලෙස විදහා දැක්වීමයි. එය ආරම්භවූදා සිටම විශේෂයෙන්ම 20 වන සියවසේදී ලත් අත්දැකීමවලට අනතුරුව ධනවාදීන්ගේ කුලී මෙහෙවර කරන්නවුන් මාක්ස්වාදය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයට යොදාගත නොහැකිබැව් ඒත්තු ගැන්වීමට වෑයම් කලහ. එසේ මාක්ස්වාදය යල්පැන ගොස් ඇතිනම් ධනවාදී පද්ධතියේ ක්‍රියාකාරකම් එම පද්ධතිය සුරකින අයට වඩා අපවැනි මාක්ස්වාදීන් හට හොඳින්ම තේරුම් ගැනීමට හැකිනොවුනේ කෙසේද? පැන්සිස් ෆුකුයාමාගේ කථිකයා වෙමින් ඉතිහාසයේ අවසානයට අප එලඹ ඇතැයි ඔවුහු විතර්ක ඉදිරිපත් කළහ. 1990 වර්ෂයේදී ස්ටැලින්වාදය බිඳවැටීමෙන් පසුව වෝල් ස්ට්‍රීට් ජර්නලය ප්‍රකාශ කලේ අපි (ධනවාදය) දිනුවෙමු කියාය.

එවකට පැවති ඒකාධිකාරී ස්ටැලින්වාදී රාජ්‍ය පද්ධතිය බිඳ වැටීමෙන් උද්ගතවූ සැලසුම් සහගත ආර්ථිකය ඇවර කිරීමෙන් ඇතිවන ප්‍රතිපලය වැඩ කරන ජනතාවගේ ඓතිහාසික පරාජයක් බව මාක්ස්වාදීහු අවබෝධ කර ගත්හ. රුසියාවේ හා නැගෙනහිර යුරෝපයේ සැලසුම්ගත ආර්ථිකයන් නිලධාරීවාදය නිසා යම් පසුබෑමකට ලක්වී තිබුනා වුවද වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පදනම් අනුව අනාගතයේ සකසනු ලබන ආර්ථිකයක් මෙසේ විය හැකියයි උපකල්පනය කිරිමට යම් ස්ථාවරයක් එමගින් සපයනු ලැබිණි.

මහපොලව මත සිදුවූ මහා දෙදරුමක් වැනි ස්ටැලින්වාදයේ බිඳවැටීම තේරුම් ගැනිම බොහෝ මාක්ස්වාදීහු ප්‍රතික්ෂේප කලහ. ඉන් පසුව සමහරෙක් අරගල භූමිය අත්හැර ගියහ. කම්කරු ජාත්‍යන්තරයක් සඳහා කමිටුව (CWI) මෙය පරාජයක් බව තේරුම් ගත්තේද 1930 සිදුවුවාක් මෙන් පැසිස්ට්වාදය නිසා කම්කරු සංවිධාන විනාශවී යාම වැනි සිද්ධියක් ඇති නොවන බවද අවධාරණය කළහ. මෙය ඇත්ත වශයෙන්ම මතවාදී ස්වභාවයේ සිදුවූ ගැඹුරු වෙනසක් නිසා හටගත් දෙයකි. එම අවස්ථාවේදී බොහෝ දුරට හුදකලාව සිටී අපි මෙසේ අනාවැකි පල කලෙමු. ස්ටැලින්වාදය බිඳවැටීම නිසා ධනවාදයට රුකුල් දුන් ක්‍රමවේදයන්ම පසු අවස්ථාවකදී එම පද්ධතිය තුලදීම යලි හැකිලී යනු ඇති බව අපි දුටිමු.

1987දී අවපාතයක් ඇතිවීම පිළිබඳ විවිධ අය අනාවැකි පල කලහ. එහෙත් එය එසේ නොවන බවත් ජර්මනියේ හා ජපානයේ ඇති සංචිතයන් උපයෝගී කර ගනිමින් ධනවාදීන්ට තාවකාලිකව මෙම තත්වයෙන් සහනයක් ලබාගත හැකි බවත් අපි කිවෙමු. එසේ වුවද යලි 2007 වන විට මෙම පද්ධතිය ඉතා ගැඹුරු අර්බුදයක නිමග්න වන බවටද අපි අනාවැකි කිවෙමු. දැන් එය සැබෑවක් වී ඇත. අපගේ විශ්ලේෂණයට පාදක වුයේ වෙනත් ලෝහ රත්රන් බවට හරවන සින්දුරම් ශාස්ත්‍රය වැනි මායාකාරී මත මවන ආර්ථික විද්‍යාඥයින්ගේ දැක්මක් නොව ධනවාදී පද්ධතිය පිළිබඳව වන විද්‍යාත්මක දැක්ම මතය. මෙය ට්‍රොට්ස්කි පෙන්වා දෙන ප්‍රවේශයට බෙහෙවින් සමාන වෙයි. ට්‍රොට්ස්කිගේ ප්‍රවේශයට පාදක වුයේ මාක්ස්ගේ ක්‍රමවේදයන්ය. දැනට පවත්නා තත්වය පිළිබඳව යම් අදහසක් මගින් නිවැරදි පැහැදිලි කිරීමක් ලබා දෙන්නේද එම අදහස කෙතරම් පැරණි වුවද එය හොඳම ක්‍රමවේදයට පාදක වන්නේය. ධනපති පන්තිවලට අයත් කේවට්ටයින්ට වඩා ඉදිරියේදී සිදුවිය හැකි දේ ගැන අනාවැකි පල කිරිමට මාක්ස්වාදයට ඇති සුබුද්ධිකතාවය අවසානයේදී හොඳින්ම තහවුරු විය.


ජෝශප් ස්ටාලින්

ලෝකයේ නව යටත් විජිතවාදී රටවල් සඳහා ට්‍රොට්ස්කිගේ නිර්වචනයක් වන නොනවතින විප්ලවය අද යටපත් කළ නොහැකි සාධකයක් බවට පත්ව ඇත. එමගින් කියවෙන්නේ නූතන යුගයේ සිදුවිය යුතු ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවීය ධනවාදීන් තුලින් ඉටුකර ගත නොහැකි බවයි. ලෝකයේ මෙම නව යටත් විජිතවාදී රටවල දුර්වල බවින් යුතු පාලක පන්තිවලට ඉඩම් ප්‍රතිසංස්කරණ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් හා පාර්ලිමේන්තුවක් අධිරාජ්‍යවාදයේ විලංගු වලින් මුදාගත් ආර්ථිකයක් හා දේශපාලනයක් යන කාර්යභාරයන් ඉටු කිරීමට ශක්තියක් නොමැත. දුගී ගැමි ජනතාව සමග කම්කරු පන්තිය සන්ධාන ගතවීම තුලින් සමන්විත ආණ්ඩුවකින් පමණක් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සම්පූර්ණ කළ හැක. එහෙත් එවැනි ජයග්‍රහණයක් ඔවුන් අත්පත් කර ගැනීමට නම් ජාතික තලයේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද සමාජවාදී කාර්යභාරය ඉටු කිරීමට ඔවුහු පෙල ගැසිය යුතුය. ධනවාදය හා නින්දගම් පරවේණි ක්‍රමය අතුගා දැමීමට රුසියානු විප්ලවය සමත්වුවා සේම එය මුළු ලොවපුරා විප්ලවීය රැල්ලක් බිහි කිරීමටද හේතු පාදක විය.

## රුසියානු විප්ලවීය හා ස්ටැලින්වාදයේ නැගීම

1917 දී රුසියාව ක්‍රම සම්පාදනයට හා සමාජවාදයට පමණක් නොව මුළු ලෝකය පුරා මහජනතාවට කම්කරු පංතියේ ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත කරන පහන් ටැඹක් විය. ස්ටැලින්වාදය ගලා යන්නට පටන් ගත්තේ රුසියානු විප්ලවයේ මූලික අවදියේදී නොව එය හුදකලා වීමත් සමගය.

එම වකවානුව වන විට රතු හමුදාව සමග ඉමහත් ලෙස බලවත් වුයේ ස්ටැලින්ට වඩා ට්‍රොට්ස්කිය. ට්‍රොට්ස්කි යුධ හමුදා සෙබළුන් අතර පමණක් නොව ඉහල මට්ටමේ නිලධාරීන් සමගද ඉතා හිතවත් විය. ඔහු එම හමුදාව සමග සිවිල් යුද්ධයේදී සටන් කර තිබූ අතර ඔවුහු අධිරාජ්‍යවාදීන්ගේ හමුදා කණ්ඩායම් 21ක් පරාජය කර තිබිණ. නමුත් එම හමුදාවේ ඉල්ලීම මත තමා බලය භාරගත හොත් සමහර විට ඉදිරි කාලයේදී වඩාත් දරුණු හමුදාමය නිලධාරීවාදයකට මැදිව තමා ඔවුන්ගේ සිරකරුවෙකු වීමට ඉඩ ඇති බව ට්‍රොට්ස්කි අවබෝධ කර ගත්තේය. එවකට පැවති රුසියානු විප්ලවයේ හුදකලා බව නිසා හමුදාමය නිලධාරීවාදය වඩාත් වර්ධනයවීමට බොහෝ ඉඩකඩ තිබෙන බැව් ඔහු වටහා ගත්තේය.

මෙයින් ඒත්තු යන්නේ මාක්ස් එංගල්ස් හා ලෙනින් මෙන්ම සමාජවාදය හා මාක්ස්වාදය වර්ධනය වන්නේ උපක්‍රම මගින් හෝ කණ්ඩායම් මගින් හෝ සිදුවිය හැකි කුමන්ත්‍රණ මගින් නොවන බව ට්‍රොට්ස්කි අවබෝධ කර ගෙන සිටි බවයි. සමාජවාදය හා මාක්ස්වාදය පිවිතුරු ලෙස සැබෑ ලෙස වර්ධනය වන්නේ කම්කරු පන්ති ජනතාවගේ සවිඥණිකත්වය මත රදා සිටිමින් හැම අවස්ථාවකදීම එහි දේශපාලන අර්ථය හඳුනාගනිමින් පැහැදිලි වැඩ සටහන් සටන්පාඨ හා සංවිධානාත්මක ව්‍යුහයන් ඉදිරියට ගෙනයාමට තැත් කිරීමෙන් පමණක් බව වටහා ගත යුතුවේ. ස්ටාලින්වාදය බිඳ වැටීමෙන් පසුව විශේෂයෙන්ම සැලසුම් සහගත ආර්ථික පද්ධතිය දුර්වලතාවයකට පත්වීමෙන් පසුව අපගේ ජාත්‍යන්තරයද දුර්වල තත්වයකට පත්විය. යථා තත්වය ප්‍රතික්ෂේප කිරීමට තැත් කල සමහරෙක් එවකට පැවැති දුෂ්කර වාස්තවික තත්වය හමුවේ නිරුත්තර වුහ. බොහෝ දෙනෙක් මෙම තත්වය යථාවාදී ලෙස දැකීම ප්‍රතික්ෂේප කළහ. සමහරෙක් එය හැඳින්වූයේ ස්ටැලින්වාදය බිඳවැටීම හේතුවෙන් එය ජයග්‍රහණයක් වු බවයි. එහෙත් එම බිඳවැටීම සැලසුම් සහගත ආර්ථිකය දුර්වලතාවයට පත්වීම සමග අතිනත ගෙන සිටින බව ඔවුහු නොපැවසුහ.

**- පීටර් ටැෆ් -**
(එංගලන්ත සමාජවාදී පක්ෂයේ ලේකම්)

- 6 පිටුවට.....

# චීනයේ ආර්ථිකය තීරණාත්මක අර්බුදයක



මෙහි තිබෙන විශාලතම ප්‍රවෘත්තිය චීන ආර්ථිකය පිලිබඳව නොවේ, ඒ චීනයේ නායකයන් පිලිබඳවයි. ඔවුන්ගේ අති විශිෂ්ට දක්ෂතාවය ගැන, ඉදිරිය දැකීමට ඇති හැකියාව ගැන ඔබ අසා ඇති සියළු දේ අමතක කර දමන්න. අද දිස්වන ඔවුන්ගේ අතිරණාත්මක වැනෙන සුළු ක්‍රියාවන් ගැන හොඳින් විනිශ්චයක් කරන විට පෙනී යන්නේ, ඔවුන් කරන්නේ මොනවාද යන්න ගැන ඔවුනට කිසිදු අවබෝධයක් නැති බවයි.

ඉතා රළු ලෙස තම විනිශ්චය මෙසේ කියා පාන්නේ නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥයෙකු වන පෝල් කෘග්මන් (Paul Krugman) ය. ඔහු එසේ විනිශ්චය කරන්නේ චීන තොග වෙලඳ පොල කඩා වැටීමත්, එය රැක ගැනීමට චීන රජය ගන්නා උත්සාහයත් අධ්‍යයණය කරමිනි. ෂැංහයි හා ෂෙන්ෂෙන් හි කොටස් වෙලඳ පොල 30% කින් පසුබෑම නිසා, ජුනි මාසයේ මැද සිට ඩොලර් ට්‍රිලියන හතරක් වන දැවැන්ත මුදලක් සහිත කොටස් අගයක් මළුමනින්ම සිඳී ගොස් ඇත.

කෘග්මන් පවසන පරිදි, මෙයට පෙර බොහෝ ධනවාදී විචාරකයන්ගේ ආකල්පය වූයේ චීනයේ නාමිකව හඳුන්වන කොමියුනිස්ට් පක්ෂයේ (CCP) ආඥාදායකයන් අති දක්ෂ ආර්ථික කළමණාකරුවන් වන බවය. රාජ්‍ය මැදිහත් වීම තුලින් හා කිසිදු සීමාවක් රහිත මුල්‍යමය සම්පත් දක්ෂ ලෙස භාවිතා කරමින් ආර්ථික ගැටළු මතු වූ හැමවිටකම ඔවුනට මැජික් බලයෙන් මෙන් විසඳුමක් ලබා දීමට හැකිවිය. එහෙත් පසුගිය සති කීපය තුල චීන කොමියුනිස්ට් පක්ෂය කෙරෙහි තැබූ එම විශ්වාසය අන්තයටම සෙලවී ගියේය. තොග වෙලඳ පොල පක්ෂයේ නියෝග වලට අවනත නොවන විට, චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකයින් සමකල හැකි වූයේ කැනියුට් නමින් සිටි රජ කෙනෙකුටය. මෙම රජතුමා මුහුදේ රල වලට ආපසු හැරෙන ලෙස අණ දුන් බවත්, අවසානයේ දී එම රල සමගම ඔහුද ගසාගෙන ගිය බවත් ප්‍රසිද්ධ ජන ප්‍රවාදයකි.

## කම්කරුවන්ගේ ඉතිරි කිරීම් අර්බුදයට

කොටස් වෙලඳ පොල පාඩු සිදුවීම නවත්වා ගැනීම පිණිස පසුගිය මාසය තුල කොටස් මිල දී ගැනීමටත් අනෙකුත් එවැනි ආරක්ෂාකාරී කටයුතු සඳහාත් ඩොලර් බිලියන 800 ක් වැය කල නමුත්, එම තොග වෙලඳ පොල කඩා වැටීම නවත්වා ගැනීමට චීන රජයට නොහැකි විය. මෙය චීනයේ බොහෝ ජනතාවන්ට බෝම්බ ප්‍රහාරයක් එල්ල වූවාක් වැනි විය. මෙය වඩාත්ම බලපෑවේ මිලියන් හැටකටත් වඩා වැඩි කුඩා පරිමාණයේ වෙලඳුන්ටය. පසුගිය වසරක කාලයක් තුල තොග වෙලඳ පොලට එක්වන ලෙස ඔවුනට බලකර තියා තිබුණි.

මගේ පියාට ඔහු ඉතිරි කරගත් දෙයින් සියයට අනූවක්ම අහිමි විය. මෙසේ පවසන්නේ චීනයේ (CWI) සංවිධානයේ සාමාජිකයෙකු වන යූය. ((CWI) යනු චීනයේ ඊනියා කොමියුනිස්ට් නිලධරය විසින් තහනම් කර ඇති සමාජවාදී පක්ෂයේ සොයුරි සංවිධානයයි.) මගේ පියාත් ඔහුගේ සහායකයනුත් මෝටර් රථ කොටස් කර්මාන්ත ශාලාවක සේවය කරනවා. මෙම වසරේ මාර්තු මාසයේදී ඔවුන් කොටස් මිලදී ගැනීමට තිරණය කළා. යූ පවසයි. චීනයේ හැම කෙනෙක්ම කොටස් වෙලඳ පොල ගැන කථා කරනවා. රජය විසින් පාලනය කරනු ලබන මාධ්‍ය මගින් කොටස් මිල දී ගැනීමට සාමාන්‍ය ජනතාව පොලඹවනු ලැබුවා. තොග වෙලඳ පොල (SCI ; Shanghai Composite Index) 10000 අගය දක්වා වැඩි වන බවට ඔවුන් අනාවැකි පල කලා. මගේ පියාත් ඔහුගේ සහායක පිරිසත්, මේ වන විට විශාල ලෙස පාඩු ලබා තිබෙනවා. චීන රජය විශ්වාස කිරීමට තමා මෝඩ වූ බව දැන් ඔවුන් සිතනවා.

## බලහත්කාරී රාජ්‍ය වෙලඳපොල

ඇත්ත වශයෙන්ම 2014 ජුලි සිට 2015 ජුනි 12 දක්වා (SCI) අගය 2000 සිට 5200 දක්වා වැඩි වුනා. ( එය සියයට 150% වැඩි වීමකි.) නමුත් දැන් එම අගය 3500 දක්වා පහතට වැටී ඇත. ඇත්ත වශයෙන්ම සිදුව ඇත්තේ රජය විසින් හසුරුවන ලද බලහත්කාරී වෙලඳ පොලක් නැතිනම් මුල්‍යමය උත්පාතයක් නිර්මාණය වී තිබීමයි. එසේ වූයේ උමතුවෙන් මෙන් ක්‍රියාකල මාධ්‍ය ව්‍යාපාර මගින් පමණක් නොවේ. ණය ලබා ගැනීමද තුලිනි. එය හඳුන්වනු ලබන්නේ රාජ්‍ය බලහත්කාරී පිම්ම නැතිනම් සී ජින් පිංග් ගේ, හෙවත් චීන ජනාධිපතිගේ බුල් මාර්කට් යනුවෙනි.



චීන ජනාධිපති සී ජින් පිංග්

මෙසේ වෙලඳ පොල කඩා වැටීම චීන කොමියුනිස්ට් පක්ෂයේ ආඥාදායකයින්ට මහත් ව්‍යසනයක් වෙයි. එමගින්, චීනයේ රාජ්‍ය මාධ්‍ය ඒකාධිකාරිත්වය තුලින් හෝ සම්පූර්ණයෙන්ම වසා ගත නොහැකි තරමට ප්‍රතිපත්ති අක්‍රමික වීමට හා වැරදි පියවර ගැනීමට සිදු වී තිබේ. යුගේ පියා ගෙන හැර පාන අයුරින්, මේ හේතුවෙන් අනියම් දේශපාලන ඵල විපාකවලටද චීනයට තුඩු දිය හැකි බවයි.

රජය විසින් තොග වෙලඳ පොල බුබුල ප්‍රසාරණය කිරීමට එක් හේතුවක් වූයේ නාගරික මධ්‍යම පාන්තික ජනතාව හා කම්කරු පන්තියේ තරමක් ධනවත් පිරිස උත්තේජනය කර ඒකාධිපති ක්‍රමයට සහාය දීම සඳහා එම පිරිස් ඇද බැඳ තබා ගැනීමයි. එමෙන්ම, වසර 25ක් වන කාලය තුල ඉතාම අඩු මට්ටමේ වර්ධන වේගයක් වාර්තා කරමින් හින වන ආර්ථිකයට සහායක් වන ලෙස පාරිභෝගික වියදම් නැතිනම් මිල දී ගැනීම් නංවාලීමය.

## චීනයේ රුසියානු පුටින්

මෙවැනි වර්ධනයන්ට බිය වීමට චීන කොමියුනිස්ට් පක්ෂ රජයට බොහෝ හේතු කාරණා ඇත. ඔවුහු තම බලය දිගටම පවත්වා ගන්නේ අධිවේගයෙන් සිදුවන ආර්ථික වර්ධනය හා රාජ්‍ය මර්දනය ඒකාබද්ධ කර ගැනීම තුලිනි. 2012 වසර පසු භාගයේදී සී-ජින්-පිංග් බලයට පත්වූවාට පසුව, අත්අඩංගුවට ගැනීම්, තොරතුරු වාරණය කිරීම් හා අති නවීන තාක්ෂණික ආවේක්ෂණය වැනි කරුණු වඩාත් වර්ධනය විය. ඒ සමගම ජාතිවාදය වර්ධනය කරමින්, ගෝලීය කරලියේ සී ඉතා ශක්තිමත් පුද්ගලයෙකු බවට හුවා දක්වනු ලැබිණි. රුසියාවේ ව්ලැඩිමීර් පුටින් යම් තරමකට අනුකරණය කරමින් සී තව තවත් බලය තමා වෙතටම ඒකරාශී කර ගැනීමට පියවර ගත්තේය. යුද හමුදාව, පොලිසිය, පක්ෂයේ රාජ්‍ය යාන්ත්‍රණය පමණක් නොව, සාමාන්‍යයෙන් ජනාධිපති කාර්‍යයභාරයට යටත් නොවන ආර්ථික ප්‍රතිපත්ති පවා තම අණසකට යටත් කර ගැනීමට ඔහු කටයුතු කළේය. මෙම අරමුණ සාක්ෂාත් කර ගත්තේ දූෂකයින් පන්නා දැමීමේ මායාවක් යටතේ දශක ගණනාවක් පුරා ඉතාමත් දැඩි, තිව්‍ර ප්‍රභූ මට්ටමේ අය වෙත බලය තහවුරු කර ගැනීමේ බල අරගලයක් දියත් කිරීම තුලිනි.

චීන ජනාධිපති සී ජින්ගේ පවුලේ වටිනාකම ඩොලර් මිලියන 376 ක් වාර්තාවේ. මෙය බ්‍රිතාන්‍යයේ ඉතාමත් ධනවත් කැබිනට් සාමාජිකයෙකුගේ වත්කම මෙන් තුන්ගුණයකි. සී ජින් චීනයේ නැගී එන කුමාරවරුන්ගේ නියෝජිතයෙකි. නැගී එන කුමාරවරුන් යනු එහි කොමියුනිස්ට් පක්ෂයේ පැරණි ප්‍රවීණයන්ගේ වර්තමාන දූ දරු පරම්පරාවය. පසුගිය දශක දෙකක කාලයක් තුල ඔවුහු ආර්ථිකයේ ප්‍රමුඛ ක්ෂෙත්‍රයන්හි තම බලය පතුරවමින් කොමියුනිස්ට් නාමයෙන් දැවැන්ත ධන සම්භාරයක් අත්පත් කරගෙන සිටිති.

සී ජින්ගේ ක්‍රමවේදය වන්නේ චීන කොමියුනිස්ට් පක්ෂයේ ඒකාධිපති සංවිධාන හා යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කිරීමත් ඒ සමගම කුමාරවරුන්ගේ ආර්ථික බලය තවදුරටත් සාමාන්‍ය දෙයක් ලෙස පැල පදියම් වන අයුරින් වඩා නව - ලිබරල්වාදී ධනවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත්ය. එසේ වුවද, පෙර සිට පැවති සාමුහික ඒකාධිපතිත්වය ආකෘතියෙන් සී ක්‍රමයෙන් ඉවත් වීම තුලින් තද බල ගැටළු ඇති වීමට හා වරද්දා ගැනීමට ඉඩ ඇත. එවිට මෑතදී ඇති වූ තොග වෙලඳපොල කඩා වැටීම වැනි සෑම පසුබෑමකටම සී හට පෞද්ගලිකව වගකියන්නට සිදු වනු ඇත. චීන ජනාධිපති සී ජින් පිංග්ගේ ප්‍රතිපත්ති ඔහුගේ රටාව පිලිබඳ ප්‍රශ්නයක් නොවේ. එහෙත් එය චීන රජය තුල ඇතිවන හා අනුක්‍රමයෙන් ගැඹුරු වන අර්බුදයන්, විප්ලවයකට අර අඳින යම් පෙර ගැටුම් නිර්මාණය කිරීමක් වනු ඇත.

පසුගිය මාස 12 තුල බොහෝ දුරට කර්මාන්ත ශාලා වසා දැමීම නිසා කම්කරුවන්ට නොගෙවන ලද වැටුප් ලබා ගැනීම සඳහාත්, වන්දි ලබා ගැනීම සඳහාත්, වැඩ කරන ජනතාව සහභාගී වන වැඩ වර්ජන සංඛ්‍යාව තුන් ගුණයකින් ඉහල ගොස් ඇත. විශේෂයෙන්ම දකුණු චීනයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉතා වැදගත් කේන්ද්‍රිය ප්‍රදේශය ලෙස සැලකෙන ගුවාංග්ඩොංග් හි, කම්කරු අරගල චීන නිලධරයේ දැඩි මර්ධනය නොතකා ව්‍යුහාත්මක හා සංවිධානාත්මක වී ඇත. මේ හේතුවෙන් සමහර කාර්මික අරගල වැඩි කාලයක් පුරා දිස් වී ඇත. එමෙන්ම හාම්පුතුන් හෝ අධිකාරීන් සිය පොරොන්දු කඩ කල විට යලි සේවය ආරම්භ කිරීමට බොහෝ සෙයින් පමා කොට ඇත.

පසුගිය වසරේ හොංකොංහි පැවති කුඩ විප්ලවය ලෙස හැඳින්වුනු ජනතා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය හේතුවෙන් චීන රජයේ භීතියද වඩාත් තිව්‍ර වී ඇත. මෙම කුඩ විප්ලවයට විවිධ අවස්ථාවලදී මිලියන 1.2 පමණ ජනතාව සහභාගී වී ඇත. ( එනම් නගරයේ ජනගහණයෙන් හයෙන් එකක් පමණ වේ. ) එවැනිම වූ මහා ජනතා විරෝධතාවන්ට මුහුණ දීමට තායිවානයටද සිදුවිය. චීනය තායිවානය ගැන සලකන්නේ තමාගේ දේශ සීමාවට අයත් ප්‍රදේශයක් ලෙසය. මැකෝ දිවයිනේද එවැනිම විරෝධතා ඇති විය. චීන ජනාධිපති සී ජින් පිංග්ගේ රාජධානියේ දේශසීමා මායිම් අද්දරින්ම ඇති වූ මෙම කැලඹීම් ඊලඟ කාල පරිච්ජේදය තුල චීනය අභ්‍යන්තරයේද සිදු විය හැකි දේ පිලිබඳ යම් පූර්ව අත්දැකීමක් ලබා දීමට බොහෝ ඉඩ ඇති බව නිසැකය. චීනයේ පවතින ඊනියා කොමියුනිස්ට් පාලනය ගැන වර්ණනාවෙන් කථා කරන අප රටේ ජනතා විමුක්ති පෙරමුණ වැනි සංවිධාන චීන නිලධරයේ පිරිහීම ගැන වචනයක් හෝ කථා නොකරති. ජනතා විමුක්ති පෙරමුණ පසුගිය මැතිවරණය වෙනුවෙන් ඉදිරිපත් කළ ඔවුන්ගේ ප්‍රකාශණය පෙන්වන්නේ චීන පාලකයින් මෙන්ම ඔවුන්ද සමාජවාදයෙන් කෙතරම් දුරට දුරස්ත වී ඇද්ද යන්නය.

**- වින්සන්ට් කෝලෝ -**

**හොංකොං සිට ලියයි.**

- 3 පිටුවෙන්.....

75 Trotsky සැමරුම....

මෙම පසුබිම තුළ අපගේ ජාත්‍යන්තරය ට්‍රොට්ස්කිගේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ධජය දිගටම ඔසවාගෙන සිටියහ.

කම්කරු පන්තිය විටෙක ස්වයංසිද්ධිකව සමාජය වෙනස් කිරීමට තැත්කල අවස්ථා ගැන ට්‍රොට්ස්කි කීපවාරයක්ම පෙන්වා දුන්නේය. ස්පාඤ්ඤ විප්ලවයේදී ස්පාඤ්ඤය පුරා බලයෙන් පහෙන් හතරක්ම අත්පත් කර ගත්තේ කම්කරු පන්තියයි. එම විප්ලවය පැසිස්ට්වාදී ප්‍රැන්කෝගේ 1936 කුමන්ත්‍රණය සුනුවිසුනු කලේය. එහෙත් එවිට ස්පාඤ්ඤයේ පැහැදිලි මහා කම්කරු පක්ෂයක් නොතිබිණ. එනිසා විකල්පයක් ලෙස කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බිහි නොවීම නිසා කම්කරු පන්තිය සතුව තිබූ බලය ඔවුන්ගේ අතින් ගිලිහී ගියේය. මෙවැනිම වූ තත්වයක් 1968 වර්ෂයේ ප්‍රංශයේ සිදුවූ සිදුවීම් තුලින්ද 1974 -75 කාල තුල පෘතුගාලය තුල ඇතිවූ සිදුවීම් තුලින්ද වෙනත් නොයෙක් අවස්ථාවලදිද දක්නට හැකිය.

## මාක්ස්වාදී ක්‍රියාමාර්ගයක් උදෙසා අද දවසට ගතයුතු පාඩම් මොනවාද?

කාර්මික තලයේ මෙන්ම දේශපාලන කරලිය තුලද කම්කරු පන්ති අරගල ඒකාබද්ධ කරමින් අති විශාල නව බලවේග යක් නිර්මාණය කිරීමේ ඉතා හදිසි අවශ්‍යතාවයක් අද පැනනැගී ඇත. 1990 ගනන්වල මුල භාගයේදී පෙන්වාදුන් අයුරින් සංවිධානය මේ සඳහා ද්විත්ව කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම අප වෙත පැවරී ඇත. එම ද්විත්ව කාර්යභාරයක් වන්නේ ජනතා ව්‍යාපාරයක් සඳහා සමාජවාදී අදහස් පුනරුත්ථාපනය කිරීම සඳහා සටන් කිරීමත් මාක්ස්වාදී - ට්‍රොට්ස්කිවාදී පැහැදිලි වැඩ සටහනක් පවත්වාගෙන යාමත්ය.

ඉතිහාසයේ මහත්සේ පුපුරා හැලෙන යුගයක අද අපි ජිවත්වෙමු. එක් රටකින් තවත් රටකට බෝවන රෝගයක් සේ ආර්ථික අර්බුදය පැතිර යන බව අද ඔප්පුවී ඇත.

## සමාජවාදය කෙතරම් දුරට ව්‍යාප්තවේද?

මාක්ස් හෝ කෙදිනකවත් අපේක්ෂා නොකල පරිද්දෙන් ගෝලියකරණය විසින් එයට පදනමක් නිර්මාණය කර ඇත. වියට්නාම් විප්ලවයේදී අධිරාජ්‍යවාදීහු ඩොමිනෝ බලපෑම පිලිබඳ න්‍යායයක් වර්ධනය කළහ. එම න්‍යායාට අනුව එක් රටක් ධනවාදය ඉදිරියේ පරාජය වුවහොත් මුළු අග්නිදිග ආසියාවේම රටවල් එවැනිම කඩා වැටීමකට බඳුන් වනු ඇත. එක්තරා ප්‍රමාණයකට මෙය ඔප්පුවී තිබේ. දියුණු කාර්මික රටවල නැතහොත් අර්ධ වශයෙන් කාර්මීකරණයවූ ග්‍රීසිය වැනි රටක ලබාග න්නා එක් ජයග්‍රහණයක් යුරෝපය පුරා මෙන්ම සමස්ත ලෝකය පුරාම ශක්තිමත් අයුරින් රාව ප්‍රතිරාව නංවයි. ලෝකයේ දල දේශිය නිෂ්පාදනයට ග්‍රීසියේ දායකත්වය 0.5%ක් පමණකි. එහෙත් ග්‍රීසිය දැවැන්ත දේශපාලන බලපෑමක් ඇති කිරීමට මුල්වී ඇත. ප්‍රාග්ධනයේ ප්‍රහාරයන් යටපත් කිරීමට කම්කරු පන්තිය සිය සටන්කාමීත්වය තුලින් දරන ප්‍රතිරෝධය සංකේතවත් කිරීම මුළු යුරෝපය පුරාම සිදුවීමට නියමිත මහා වැඩ වර්ජන දෙස කම්කරු පන්තිය අපේක්ෂාවෙන් යුතුව බලා සිටිති.

මේ සියළු සිදුවීම් යුරෝපයේ හා මුළු ලෝකයේම කම්කරු පන්තිය උදෙසා නව පරිච්ඡේදයක් ආරම්භ කිරීමට අතවනයි. දේශපාලනික වශයෙන් කිසිදු වැදගත්කමක් නැති අයෙකු ලෙස සිය විරුද්ධවාදීන් විසින් මේ වන විට ට්‍රොට්ස්කි පහත් මට්ටමකට ඇද දැමීමට උත්සාහ දරා ඇත. මෙසේ පහර දෙන පිරිස අතර රොබට් සර්විස් අන්තිමට එක්වූ පුද්ගලයා වන්නේ නැත. එහෙත් නුදුරේදීම මතුවන දරුණු පිපිරීම් සහිත කාල පර්ච්ජේදයේදී කම්කරු ව්‍යාපාර අතර පමණක් නොව සමස්ත මානව වර්ගයාගේම අරගලය තුලදී ට්‍රොට්ස්කි ප්‍රධානතම පුද්ගලයා ලෙස යලි උද්ධිපනයට පත්වනු නිසැකය.



# මහින්ද 58 ලක්ෂයෙන් මාකර්ට් කල හැකිද?

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මහ මැතිවරණයට කැන්දාගෙන ඒමට අබිබගාත කල්ලිය ගත් තින්දු වැරදිය. ඔහු වටා සිටි නුගේගොඩ කල්ලිය (විමල්, උදය, වාසු) ගණන් හැදුවේ 58 ලක්ෂයක් අතේ තියාගෙනය. ඔවුන්ගේ තර්කය වූයේ මෛත්‍රී ජනාධිපති ශ්‍රීලනිපයේ නායකයා නිසා රනිල් විරෝධී සියලු ඡන්ද පහසුවෙන් ඔවුන්ට ලබාගත හැකි බවයි. මේ නඩයට අමතකවූ එක කරුණක් තිබුනි එනම් මහින්ද රාජපක්ෂ අගමැති අපේක්ෂකයා ලෙස නැවත කරලියට පැමිනීම සන්ධානයට හෙනහුරා ලබනු ඇති බවයි. ජනවාරි 8 වන දින මේ රටේ ජනතාව පරාජයට පත්කලේ මහින්ද රාජපක්ෂ මිස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවේ. ඒ නිසයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති ලෙස තේරාපත්කර ගත්තේ. ජනාධිපති සිහිනය අහිමිව අගමැතිවීමේ සිහිනයට කැදවාගෙන ආවේද ඒ මහින්දමය. රටට පිළිලයක්වූ රාජපක්ෂ පලමු වර පමණක් නොව දෙවන වරද පරාජය කිරීමට ජනතාව පසුබට නොවීය. එය මේ රටේ ජනතාවගේ වාසනාවකි. එපමනක් නොව අගෝස්තු 17 මහින්ද පරාජයට පත්වූයේ 58 ලක්ෂයෙන්ද ලක්ෂ10ක් අහිමිකර ගෙනය. ඒ අනුව මහින්ද ප්‍රමුඛ නඩයට ලබාගත හැකිවූයේ ලක්ෂ 47කි.

අගෝස්තු 17 වෙනිදා ප්‍රථිපලය තවත් අඩුවීමට හේතුවූයේ පසුගිය මාස 6ක කාලය තුල රාජපක්ෂවරුන්ගේ වැඩ ගැන අහන්නට ලැබුනු දේවල් හා දකින්නට ලැබුනු දේවල් අතිවිශාල වීම නිසාය. 58 ලක්ෂයේ ජනතාව ඒවා ගැන හොඳ අවබෝධයක් ඒ කාලය තුල ලබාගෙන තිබේ. ජාතියේ වීරයා ලෙස ගරුබුහුමන් කලද ඔහුගේ කෙරුම් ජනතාවට දැනගැනිමට ලැබුනේ පසුකාලිනවය. සන්ධාන නඩයේ ලොකුම අභිප්‍රාය වූයේ ජාතියේ වීරයා හා යුධ වීරයා ලෙස වැඩි හමුදා ජනගහනයක් සිටින කුරුණැගල ජනතාව මහ ඉහළින් පිලිගෙන ඡන්දය දෙන බවය. අඩුම තරමින් සන්ධානයට කුරුනැගලින්වත් පිබිදීමක් ලබා ගැනිමට නොහැකි විය. හමුදා පවුල්වත් ඔහුව පිලිගෙන නොමැති බව මේ ප්‍රතිපල පෙන්නුම් කරයි. ජනාධිපතිවරණයේ තිබු ප්‍රථිපලයටත් වඩා අඩු ප්‍රතිපලයක් මෙවර කුරුනැගලදී සන්ධානයට ලැබුනි. ඉතාම නිර්ලජ්ජිත ලෙස ජාතිවාදය, ආගම්වාදය ඇවිස්සීමට මහින්ද ප්‍රමුඛ නඩය වගබලා ගත්තේය. මහින්දගේ නැවත පැමිනීම ,මහින්ද සුළඟ, ලෙස හැඳින්වුවද ඒ සුලි කුණාටුවට අසුවී මැදමුලනට ගසාගෙන යනතුරු ඔවුන් දැන සිටියේ නැත.



අගෝස්තු 17 දා මහින්ද රාජපක්ෂ නැවත වතාවක් ප්‍රතික්ෂේප කිරීමට මේ රටේ ජනතාව පසුබට නොවීම රටේම වාසනාවකි.

රාජපක්ෂ පාලන කාලය තුල මේ රටේ සියලු පක්ෂ බේදබින්න කර කඩා විනාශ කිරීමට කටයුතු කලේය. අද ශ්‍රීලනිපය ප්‍රමුඛ සන්ධානයට අත්වී තිබෙන්නේ බුදු දහමේ සඳහන් පරිදි ,දිට්ට ධම්ම වේදනීය කර්මය, පලදීමයි. අද සන්ධානයක් හොයා ගැනීමට නොහැකි තත්වයට පත්ව ඇත. ඔහු නැවත පැමිනෙන්නේ තම පවුලේ හොර මැරකම් ආරක්ෂා කිරීමටත්, සහචරයන්ගේ හොරකම් ආරක්ෂා කිරීමටත් බව ජනතාව හොඳින් දැන සිටියේය. ඊට අමතරව විමල්, උදය, වාසු වැන්නන්ට තනියම තරඟ කර පාර්ලිමේන්තු වීමට තිබූ නොහැකියාව නිසාය. ඒ අර්ථයෙන් ගත් කල කේවට්ටයින් ජයග්‍රහණය කර ඇත. මහින්ද නැවත ප්‍රතික්ෂේපවූ භාණ්ඩයක් බවට පත්ව ඇත.

ඔවුන්ගේ සඨන් පාඨය වූයේ අලුතින් පටන් ගනිමු යන්නයි. ඔවුන්ගේ අලුත් පටන් ගැන්ම ජනතාව නැවත නැවතත් ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් අද සන්ධානයට අලුතින් පටන් ගැනීමට සිදුවී ඇත. තවදුරටත් මහින්ද සරණංග විවජාම් කියමින් යා නොහැක. ඔහුට මේ රටේ තවදුරටත් පිලිගැනීමක් නොමැති බව මේ ප්‍රථිපල පෙන්නුම් කරයි. විලිලැජ්ජා තියෙන නායකයෙක් නම් මන්ත්‍රිකමත් වෙන කෙනෙකුට දී ගෙදරට වෙලා විශ්‍රාම ගත යුතුය. නමුත් ඔහු උත්සාහ කරන්නේ විපක්ෂ නායකකම නොගෙන හෝ නිලනොවන සන්ධානයේ නායකයා ලෙස පෙනී සිටීමටය. මේ තත්වය තුල ශ්‍රීලනිලයේ අභ්‍යන්තරයේ මෙන්ම සන්ධානයේද ප්‍රශ්න බොහෝමයක් මතුකර ඇත. පක්ෂයේ ජේෂ්ඨයන්ට තැනැක් නැති බව පෙනියන පිරිස් කැරලි ගසමින් සිටින බව පෙනේ. මේ තත්වය ඔහු බලයේ සිටි වසර 10 ක කාලය තුලද දක්නට ලැබුනි. ඔහු කිසිදු ජේෂ්ඨයෙකුට පක්ෂයේ තැනක් දුන්නේ නැත. දෙවන පෙල නායකත්වයක් ගොඩනැගිමට කටයුතු කලේ නැත. නමුත් කිසිවකු එදා කටඇරියේ නැත. ඒ රාජපක්ෂ පවුලට තිබූ බය නිසාය. හිටපු ජනාධිපතිවරයාගේ එකම අභිප්‍රාය වූයේ තමාගෙන් පසු තම පුතුට බලය ලබා ගැනිමට මගපෑදාදීමය. ඒ අනුව යමින් තමාට මෙන්ම තම පක්ෂයටද අවසානයේ විනාශය ලගාකරදී ඇත.

## ජාතික ලැයිස්තුව

ජනතා විමුක්ති පෙරමුණ පාරිශුද්ධ පක්ෂයක් ලෙස පෙනී සිටියද ධනපති පක්ෂවලට ප්‍රථම ඔවුන්ගේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය සඳහා පරාජයවූ අයට දී රටටම ආදර්ශක් සපයා ඇත. ඒ අනුව යමින් සියලු පක්ෂ පරාජයවූ පුද්ගලයින් ජාතික ලැයිස්තුවෙන් පත්කර තිබේ. මේ තත්වය අනුව මේ රටේ මැතිවරණ පැවැත්වීමෙන් ප්‍රයෝජනයක් තිබේදැයි ජනතාව අසන තත්වයට පත්ව ඇත. පිරිසිදු අය පාර්ලිමේන්තුවට යවන ලෙස බෙරිහනු දුන් ජවිපෙ දූෂිත පරාජිතයන් පත් කිරීම ගැන දැන් මොනවද රටට කියන්නේ යනුවෙන් ජනතාව ප්‍රශ්න කරති. තමන්ගේ නොහැකියාව වසා ගැනිමට ජවිපේ නායකත්වය කටයුතු කර ඇත. මන්ත්‍රීධුර 20ක් අපේක්ෂා කලද ලබාගත හැකිවූයේ ආසන 6ක් පමණි. ඒ අනුව පක්ෂයේ අභ්‍යන්තර ප්‍රශ්න නිරවුල් කරගැනිමට පරාජිත අය ජාතික ලැයිස්තුවෙන් පත් කිරිමට කටයුතු කර ඇත. නැති නම් අනුර කුමාරගේ නායකත්වය ප්‍රශ්නයකට ලක්වනු නියතය. අනුන්ට බණ දේශනා කරමින් තමන්ද ඒ දේම කිරීම තුල පෙන්නුම් කර ඇත්තේ ජවිපේ කියන තරම් සුපිරිසිදු පක්ෂයක් නොවන බවයි. ජවිපෙද ගමන් කරන්නේ සමාජවාදී මාවතේ නොව ධනපති මාවතේ බව ඔවුන්ගේ පැරනි නායක සෝමවංශ අමරසිංහ විසින් පවා ප්‍රකාශ කරන ලදී. අද ජවිපෙට සමාජවාදී තෝරා ගැනිමක් නැත. ඔවුන්ට ඇති එකම මාවත පාර්ලිමේන්තු මාවත පමණී.

ශ්‍රීලනිපයේ තිබෙන ප්‍රධාන අර්බුදය දෙවන පෙල නායකත්වයක් නොමැතිවීමය. ඒ නිසා අද සියලු දෙනා මෛත්‍රී ජනාධිපතිතුමා වටා රොක් වීමට උත්සාහ කරයි. ජනාධිපතිතුමා ශ්‍රීලනිපයේ බලය අතට ගෙන කටයුතු කිරිම තුලින් ඔහුට අවශ්‍යවී ඇත්තේ තමන්ගේ ශක්තිය තහවුරු කර ගැනිමටය. මැතිවරණ සමයේ මහින්දවාදීන් හා මෛත්‍රීවාදීන් ලෙස වෙන් වෙන්ම කටයුතු කිරීම නිසා මෛත්‍රීවාදීන් පරාජය පත් විය. ඒ නිසා කෙසේ හෝ තමන්ගේ කණ්ඩායමට මන්ත්‍රීධුරයක් ලබාදී තමාගේ ගොඩ වැඩිකර ගැනිමට ජනාධිපති දරණ උත්සාහය නිසා අද පරාජයවී සිටින අය ජාතික ලැයිස්තුවෙන් පත්කිරිමට ගොස් තවත් අවුලක් හදාගෙන ඇත. ඔවුන් පරාජයට පත්වී ඇත්තේ හොරුන්, මැරවරයින්, නොසන්දාලයින් ලෙසිනි. ඒ තත්වය තුල ජනතාව ඔවුන් ප්‍රතිකෙෂ්ප කරන ලදී. මහත්මා දේශපාලනයක් තිබේයයි කියන ජනාධිපතිවරයාම මේ නොසන්දාලයින් නැවත පත් කිරිමට ගන්නා උත්සාහය අනුව ඔහුට රටේ තියෙන ප්‍රසාදය අහිමි වනු ඇත. ඔහු ගැන බහුතරයක් ජනතාව තැබූ බලාපොරොත්තු බිදවැටෙමින් තිබේ. තමන්ගේ අර්බුදය විසදා ගැනිමට උත්සාහ කරන්නේ රටේ ජනතාවගේ ජනමතයට පයින්ගසමිනි. ජනතාවගේ අභිමතය වූයේ දූෂිතයින් පරාජය කිරීමය. ඒ අනුව ඔවුන් සියලු දෙනා පරාජයට පත්විය. මහින්ද මෙන්ම සන්ධානයද අවලංගු කාසියක් බවට පත්ව ඇත. ඒ තත්වය තුල පරන පරඬැල් ටිකම නැවත පත්කිරිමට උත්සාහ කරන්නේ සන්ධානයේ තියෙන බංකොලොත්කම නිසාය. ජනාධිපතිතුමාගේ ගොඩ බේරා ගැනිමට කටයුතු කරන්නේ ගෙදර ගියොත් අඹු නසි මගහිටියොත් ඔහු නසි යන කියමන අනුවය. ජනාධිපතිවරයාට ගොඩනැගිමට සන්ධනායක් දැන් නොමැත. ඔහුට හැකි වන්නේ ශ්‍රීලනිපය නැවත ගොඩනගා ගැනීමට උත්සාහ කිරිම පමනි. මහින්දවාදීන් මැතිවරණය ජයග්‍රහණය කලද ඔවුන්ට ශ්‍රීලනිපය ජයග්‍රහණය කිරිමට තවදුරත් නොහැකිවී තිබේ. මහින්ද සාධකය තවදුරත් අලෙවි කල හැකි භාණ්ඩයක් නොවන බව නුගේගොඩ නඩය දැන්වත් තේරුම් ගතයුතුය.

**- ධම්මිකා ද සිල්වා -**

2 පිටුවෙන්.....

## අලුත් වටයකින් ඉස්මතු වන ....

එහෙත් බලයට පත් වී සති දෙකක් ඇතුලත අගමැති රනිල් වික්‍රමසිංහ ඉන්දියාවේ හින්දු පුවත් පතට ප්‍රකාශ කොට තිබුණේ 13 වැනි සංශෝධනයේ සඳහන් පරිදි ඉඩම් සහ පොලිස් බලතල පළාත් සභාවලට පැවරීමට නොහැකි බවයි.

මේ අනුව රනිල්ගේ නව රජයෙන් දෙමළ ජනයාගේ ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබා ගැනීමට හැකියාවක් ඇතැයි හිතන්නට වත් ඉඩක් නැත. එහෙත් දෙමළ ජාතික සන්ධානය තම මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් කොට තිබුණේ මෛත්‍රිපාල සිරිසේන සහ රනිල් වික්‍රමසිංහ නායකත්වය සමග සාකච්ජා මාර්ගයෙන් දෙමළ ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලබා ගත හැකි බවය.
ඔවුන් කියන විසඳුම මත ඒකාබද්ධ උතුරු- නැගෙනහිර පලාතක් සඳහා ෆෙඩරල් පාලනයක් ලබා ගැනිම මේ අනුව සිහිනයක් වනු ඇත. ෆෙඩරල් පාලනයක් තියා 13 වන සංශෝධනයේ සඳහන් පූර්ණ බලතල පලාත් සභාවලට ලබා දීමට අකමති නායකත්වය තුළ ෆෙඩරල් යනු තහනම් වචනයක් වනු ඇත. අනෙත් අතට එවන් තත්වයක් උද්ගත වන තෙක් මහින්ද රාජපක්ෂ - වීරවංශ - ගම්මන්පිල - දිනේෂ් කල්ලිය කෙළ හලමින් බලාගෙන සිටී. ගිලි හී ගිය බලය යළි ලබා ගැනීම සඳහා ඔවුන්ට ඇති එකම මාවත ජාතිවාදය ඇවිස්සීමයි. මෙන්න රට කඩනවෝ කොටියට රට දෙනවෝ වැනි සටන්පාඨයන් පෙරට ගැනීමට ඔවුහු කල් බලමින් ඇඟිලි ගණන් කරමින් සිටිති. රට ගිනි තියන්නට සමත් චීවරධාරීන් පිරිසක්ද ඔවුන්ගේ පසුපස සිටින බව අමතක නොකල යුතුය.

දෙමළ ජනයා නැවත වරක් රැවටීමට සහ පාවා දීමට ලක්වන අවස්ථාව වැඩි ඇතක නොවන බව මේ අවස්ථාවේ අපි සටහන් කරමු. මේ රටේ පාලනය මෙහෙයවන්නේ බෙලිහින පසුගාමී සිංහල ධනපති පන්තියක් විසින් බව අප බොහෝ විට පෙන්වා දී ඇත. තාමත් වැඩවසම් අක්මුල්වලින් ගැල වී නැති ඔවුන් වෙතින් දෙමළ ජනයාගේ අවම ඉල්ලීම්වත් ඉටු කර ගත හැකියයි සිතන්නේ නම් එය මුලාවකි. බොරු උප්පරවැට්ටි සහ අලංකාර වචන මාලාවක් හැර අන් දෙයක් දෙමළ ජනයාට හිමි නොවන බව පැහැදිලිය. කෙසේ වෙතත් 1977 දී මෙන් මෙවරද දෙමළ ජාතික සන්ධානයට උතුරු නැගෙනහිර දෙමළ ජනයා වෙතින් දැවැන්ත ජනවරමක් ලැබී ඇත. එදා අප්පායි පිල්ලේ අමිර්තලිංග මිගේ නායකත්වයෙන් යුතු දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ (TULF) වෙනමම ඊලාම් රාජ්‍යයක් සඳහා දෙමළ ජනයා වෙතින් ජනවරමක් ඉල්ලූ අතර මෙවර දෙමළ ජාතික සන්ධානය (TNA) ෆෙඩරල් පාලනයක් සඳහා ජනවරමක් ඉල්ලා සිටියේය. දෙමළ ජනයා ලක්ෂ ගණනින් එක්වී මේ ජනවරම ලබා දී තිබිණි. එදා (TULF) නායකත්වය ඒ ජනවරම මත සෘජුව පිහිටන ජනතා අරගලයකට යොමු නොවීම LTTE ඇතුලු සන්නද්ධ කණ්ඩායම් වල නැගී සිටීමට බල පෑ එක හේතුවක් විය. වත්මන් TNA නායකත්වයද ෆෙඩරල් පාලනයක් සඳහා දෙමළ ජනයා දුන් ජනවරම සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරන්නේ කෙසේද? ඒ සඳහා ජනයා පෙළ ගැස්වීමට ඔවුන් ක්‍රියා කරන්නේද? දෙමළ ජනතා අයිතිය වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිට ඇති දකුණේ සිංහල කම්කරු පන්තියේ සහ වමේ ව්‍යාපාරයේ සහයෝගය ලබා ගැනීමට ක්‍රියා කරන්නේද? අතීත වාර්තාව සලකා බැලීමේදී දක්ෂිනාංශික TNA නායකත්වය එවැනි මගකට යොමු වේ යයි සිතන්නට ඇති ඉඩ ඉතා අඩුය.

ඇමරිකාව, ඉන්දියාව ඇතුලු ලෝක ධනපති පන්තිය දෙමළ ජනයාගේ පිහිටට එනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වෙති. දෙමළ ඩයස්පෝරාවේ ඇතැම් කොටසක අරමුණ බව පෙනෙන්නේ සිංහල ධනපති පන්තිය නියෝජනය කරන කොළඹ ආණ්ඩුව වෙතින් තමන්ට සාධාරණය ඉටු නොවන්නේ නම් එක්සත් ජාතීන්ගේ සංවිධානය ලවා සර්බියාවේ කොසෝවෝහි දී දකුණු සුඩානයේ පළාත් වෙන් ජනමත විචාරනයක් පවත්වා දෙමළ ඊලාම් රාජ්‍යයක් ලබා ගැනීමය. වත්මන් ලෝක දේශපාලන පසුබිම තුල එය අතිශය දුරස්ථ ඉලක්කයකි. ඇත්ත වශයෙන්ම එය යථාර්ථවාදී නැත. ඊනියා ජාත්‍යන්තරයේ ප්‍රජාව මේ මොහොතේ එවැන්නකට සූදානම් නැත. විශේෂයෙන්ම ඉන්දියාව එයට ඉඩදෙන්නේ නැත. දෙමළ ජනයාට ඇත්තේ එකම විකල්පයක් පමණි. තම ජාතික අයිතිය ඉල්ලා මහපාරට බැසීම පමණි. එය යාපනයට හෝ මඩකලපුවට සීමා නොවී කොළඹට, නුවරට සහ ගාල්ලටද ගෙන යා යුතුය. මෙසේ කළ හැකිවන්නේ දකුණේ කම්කරු පන්තිය සහ වමේ සමාජවාදී ව්‍යාපාරය සමග අත්වැල් බැඳ ගැනීමෙන් පමණි.

ජාතික ප්‍රශ්නය විසඳීමේ එකම මග දෙමළ ජනයාගේ ස්වයං නිර්ණය අයිතිය පිළිගැනීම බව එක්සත් සමාජවාදී පක්ෂය දිගින් දිගටම පෙන්වා දෙයි. අවශ්‍ය නම් වෙන්වීමේ අයිතියද එයට ඇතුළත්ය. බ්‍රිතාන්‍ය සමග තුළ තවදුරටත් රැඳී සිටින්නේද යන්න සම්බන්ධව මීට වසරකට පෙර ස්කොට්ලන්තයේ පැවති ජනමත විචාරනයේදී එක්සත් සමාජවාදී පක්ෂය හා සම්බන්ධ එංගලන්ත සමාජවාදී පක්ෂය අනුග මනය කළේ එම පිළිවෙතයි. ඒ අනුව ස්කොට්ලන්ත ජනයා කැමති නම් වෙන් වී යැමට අයිතිය ඇති බවටය සමාජවාදීන් පෙනී සිටියේ. හුදු ස්වාධීන රාජ්‍යයක් බවට පත්වීමෙන් එම ජනයාට විමුක්තියක් නොලැබෙන බවත්, සමාජවාදීන් ස්වාධීන සමාජවාදී ස්කොට්ලන්තයක් වෙනුවෙන් පෙනී සිටිය යුතු බවත් සමාජවාදී පක්ෂය පෙන්වා දුන්නේය. කෙසේ වෙතත් එය මෙරට ඇතැම් සුලු ධනේශ්වර වාමාංශිකයින් කියන පරිදි සමාජවාදය බිහි කිරීමෙන් පසු ස්වයං නිර්ණය අයිතිය ලබා දීම වැනි විකාරයක් නොවේ.

මේ අනුව ස්වයං නිර්ණය අයිතිය පිලිගනිමින් දෙමළ ජාතික ප්‍රශ්නය විසඳන ලෙස එක්සත් සමාජවාදී පක්ෂය බලකර සිටී. එහෙත් මෙරට පාලනය කරන බෙල හීන - පසුගාමී ධනපති පන්තිය කිසිසේත්ම එවැන්නකට සූදානම් නැති අතර ඉන්දීය ධනපති පන්තිය ද එයට එකඟ වන්නේ නැත. එමනිසා දෙමළ ජනයාට ඇති එකම විකල්පය වන්නේ දෙමළ ජාතික අයිතිය පිළිගන්නා දකුණේ කම්කරු පන්තිය සහ සැබෑ වාමාංශිකයන් සමගත් ඉන්දියාවේ කම්කරු පන්තිය සමග අත්වැල් බැඳ ගෙන කම්හල් වැඩබිම්, ගොවිපළ සහ සරසවි මට්ටමින් අරගලයට අවතීර්ණ වීමය. අප එක්සත් සමාජවාදී පක්ෂය සමාජවාදී ඉදිරි දැක්මක් සහිතව එම අරගලයට පූර්ණ දායකත්වය මෙන්ම නායකත්වයද දීමට ක්‍රියාකරනු ඇත.

**- ශ්‍රීනාත් පෙරේරා -**

# මහින්ද - ගෝඨා පාලනයේ සිදුවූ අපරාධ ගැන වහා පරීක්ෂණ අරඹනු.

මහින්ද රාජපක්ෂ රෙජිමය සමයේ මෙරට සිදු වූ දේශපාලන මිනීමැරීම් හා පැහැරගෙන යාම් හා පහරදී අතපය කඩා දැමීම් ප්‍රමානය අති විශාලය. ලසන්ත වික්‍රමතුංග ඝාතනය, පාර්ලිමේන්තු මන්ත්‍රී රවි රාජ් ඝාතනය, උදයන් පුවත් පත් කාර්යාලයට පහරදීම, ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම, ලලිත් හා කුගන් යාපනයේදී පැහැරගෙන අතුරුදන් කිරීම යනාදී වශයෙන් පත්තර පිටු පිරවිය හැකි තරමේ අපරාධ ලැයිස්තුවක් තිබේ. වැලිකඩ සංහාරය, වැලිවේරිය රතු පස් වල ඝාතන හා කටුනායක රොෂේන් චානක මරා දැමීමට මෙම ලේඛණයට අයත් ඒවාය.

සුදු වෑන් වලින් පැහැරගෙන ගොස් මරා දැමුනු අයගේ විශාල ලැයිස්වක්ද ඇත. ඊට අමතරව රහසිගත වද කඳවුරුවල මරාදැමුනු අයද සුලු පටු නොවේ. රගර් ක්‍රීඩක වසීම් තාජුඩීන්ගේ මරණයද ඒ අතර තවත් එකකි. මේ වන විට ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්දව යුද්ධ හමුදා බුද්ධි අංශයට සම්බන්ද හමුදා නිලධාරින් ගෙන් ප්‍රශ්න කිරීම අරඹා ඇත. තාජුඩීන්ගේ මරණය සම්බන්දයෙන්ද පරීක්ෂණ යම් ආකාරයකින් ඇරඹී තිබේ.

රාජපක්ෂ රෙජිමය පාලන කාලය තුළ මෙලෙස ඝාතනය කළ, අතුරුදන් කළ හා පහර දීම් හා පැහැරගෙනයාම් කළ මිනීමරුවන් හා අපරාධ කරුවන් තවමත් නිදැල්ලේ සිටින බව රහසක් නොවේ. මෛත්‍රිගේ යහපාලනයෙන් ජනතාව අඩු තරමේ මේ අපරාධ කරුවන්ට දඬුවම් ලබා දෙනු ඇතැයි විශ්වාස කළහ. දැන් දින 100 කටාව වලංගු නොවේ. අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කිරීම දැන්වත් ප්‍රමාද නොකළ යුතුය. එසේ ප්‍රමාද කිරීමට කිසිදු හේතුවක් ඇත්තේ නැත. එලෙස නීතිය ක්‍රියාත්මක නොකරන්නේ නම් මෛත්‍රිගේ යහපාලන ආණ්ඩුවද රාජපක්ෂ හා ගෝඨාභය පාලන සමයේ සිදු කළ අපරාධකරුවන්ව ආරක්ෂා කිරීම සඳහා ගිවිසුම් ගසා ගෙන ඇති බව ජනතාවට ඒත්තු යනු ඇත.

එබැවින් පසුගිය පාලනයේ සමයේ සිදුවූ සියලු අපරාධ සම්බන්දයෙන් කඩිනම් පරීක්ෂණ ආරම්භ කරන ලෙස ඉල්ලා ජනතා ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතු තිබෙන බව රතු තරුව පුවත් පත අවධාරණය කර සිටී. ඒ සඳහා පෙරමුණ ගැනීමට දැනටමත් කටයුතු කරමින් සිටින බව රතු තරුවේ ප්‍රකාශකයෙක් අප වෙත වාර්තා කර ඇත.

# අපි සටන් වදින්නෙමු



**එක්සත් සමාජවාදී පක්ෂය උතුරේ හා දකුණේ කම්කරු පංතියේ ඒකාබද්ධ ජන අරගලයක් තුලින් කුරිරු ධනපති ක්‍රමය පෙරලා දමා සැලසුම් සහගත ආර්ථික වැඩ පිළිවෙලක් තහවුරු කර ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී පාලනයක් ගොඩනැගීමට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරයි. එම ඉලක්ක ජය ගැනීම සඳහා පහත සඳහන් මුලික කරුණු වෙනුවෙන් අප පක්ෂය පෙනී සිටී.**

◆ ඒකාධිපති පාලනයක් තහවුරු කෙරෙන විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීම වෙනුවෙන් සටන් වැදීම.

◆ මුළුරටම මිලිටෙරිකරණයට යටත්කර ප්‍රජාතන්ත්‍රිය පැවැත්ම අහෝසි කිරීමට ගෙන ඇති පියවරයන්ට එරෙහිව සටන් වදින අතර උතුරේ හමුදා පාලනය ඉවත්කර සිවිල් පාලනය තහවුරු කිරීමට බල කිරීම.

◆ ඊනියා පුනරුත්තාපන සහ රඳවා ගැනීමේ කඳවුරු අහෝසිකර සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට බල කිරීම.

◆ උතුරේ, නැගෙනහිර හා කඳුකරයේ සුළුජාතික ජනකොටස්වල ජාතික අභිලාෂයන් ආරක්ෂාකරමින් උතුරේ දෙමළ ජනතාවගේ ස්වයංනිර්ණය අයිතිය පදනම් කරගෙන ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් කටයුතු කිරීම.

◆ ලිවීමේ කියවීමේ හා කථා කිරීමේ නිදහස හා රැස්වීම් සංවිධානය වීමේ හා විරෝධතා උද්ඝෝෂණ පැවැත්වීමට ජනතාවට තිබෙන අයිතිය වෙනුවෙන් පෙනී සිටීම. කලාකරුවා හා කලාමාධ්‍ය රාජ්‍යග්‍රහණයට යටත්කිරීමට එරෙහිවීම.

◆ වැඩකරණ ජනතාවට වෘත්තිය සමිති පිහිටුවීමට හා වැඩ වර්ජන ඇතුලු වෘත්තිය සමිති කටයුතු වල යෙදීමට තිබෙන මුලික අයිතිය වෙනුවෙන් සටන් කිරීම.

◆ නිදහස් අධ්‍යාපනය විනාශකිරීමට දරණ ප්‍රයත්නයන්ට එරෙහිව සටන් වදින අතර අධ්‍යාපනය සඳහා දළ දේශිය නිෂ්පාදනයෙන් 6%ක් වෙන් කිරීමට බලකිරීම.

◆ පුද්ගලික විශ්වවිද්‍යාල ඇතුලු අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරමින් පවතින පුද්ගලීකරණය නවතා දැමීම.

◆ නිදහස් සෞඛ්‍ය සේවය රැකගැනීම හා ඖෂධ සමාගම් වල ග්‍රහණයට නතුනොවු ඖෂධ ප්‍රතිපත්තියක් ගොඩනැගීම.

◆ කාන්තාවන්ට එරෙහි හිංසනය සහ ප්‍රචන්ඩත්වය යෙදවීමට එරෙහිවන අතර කාන්තාවන්ගේ සමාන නියෝජනය හා සම වැටුප් අයිතිය තහවුරු කිරීම.

◆ උතුරේ ජනතාවගේ ඉඩම් උදුරාගැනීම වහා නතර කරන ලෙස බලකරන අතර දකුණේ පීඩිත ගොවි ජනතාවගේ ගොවිබිම් වල අයිතිය තහවුරු කිරීම.

◆ රාජ්‍ය අංශය, පුද්ගලික අංශය හා වතු කම්කරු ක්ෂේත්‍රවල කම්කරු ජනතාවට ජිවත්වීමට සරිලන වැටුප් වැඩිවීමක් ලබා ගැනීම ඇතුලුව සියලු අංශ වලට අදාලවන පරිදි ජීවන අංක ඒකකය රු.280/-ක් ලෙස වහා ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ගැනීම.

◆ විදුලිය, ජලය, තෙල් ඇතුලු මහජන උපයෝගිතා සේවාවන් වල මිල ඉහල දැමීම වහා නවතා දමන ලෙසත් එකී සේවාවන් කොටස් වශයෙන් පුද්ගලිකරණය කිරීම ගෙන තිබෙන පියවරයන් වහාම නවතන ලෙසත් බලකිරීම.

◆ ජාතිවාදී බලවේග විසින් ජාතිවාදය ඇවිස්සීම හා ආගම් අතර ගැටුම් ඇති කිරීමට දරණ නින්දිත ප්‍රයත්නයට එරෙහිවීම හා මුස්ලිම් ජාතිකයින් ඇතුලු අන්‍ය ආගම්වලට සිය ආගමික කටයුතු කිරීමට තිබෙන අයිතිය ආරක්ෂා කිරීම. හා කිසිම ආගමක් නොඅදහා සිටීමට ජනතාවට තිබෙන අයිතිය තහවුරු කිරීම.

**එක්සත් සමාජවාදී පක්ෂය කම්කරුවන් දුප්පත්ගොවීන් හා තරුණයින්ගේ නිර්ධන පංතික පක්ෂය ලෙස ඉහත අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් අභිතව සටන් වදිනු ඇත.**

# 80 වැඩ වර්ජනය ගැන කෘතියක්




1980 ජුලි මහ වැඩ වර්ජනය ලාංකේය කම්කරු පංති ඉතිහාසයේ අමරණීය සටහන් තැබූ දැවැන්ත සිදුවීමකි. 80 වැඩ වර්ජනයට 2015 ජුලි 17 වෙනිදාට වසර 35ක් ගෙවුනි. 80 වැඩ වර්ජනය ගැන පුවත් පත් වල වරින් වර වැදගත් ලිපි පළ වි ඇති නමුත් ඒ ගැන පූර්ණ වාර්තාවක් මේ දක්වා එළි දැක්වී නැත.

මෙම අඩුව පුරවාලීමවස් සිරිතුංග ජයසූරිය සහෝදරයා විසින් 80 වැඩ වර්ජනය ගැන වාර්තාමය විග්‍රහයක් අඩංගු කෘතියක් ලියා ඇත. එහි වැඩ වර්ජනයට අදාල ලිපි ලේඛණ සමග වෘත්තිය සමිති එක්සත් ක්‍රියාකාරී කමිටුවේ නිල වාර්තා හා ඡායාරූප ගනනාවක් ඇතුලත් කර ඇත.

80 වැඩ වර්ජනය නැමැති මෙම පොත දොරට වැඩීම සඳහා සිදු කරන සංවාදශීලි සාකච්ඡාවක් ඔක්තෝම්බර් 06 වන දින සවස 4.00 ට ග්‍රීන්පාත්හි මහවැලි කේන්ද්‍රයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

# ගම්මන්පිල-විමල් නරි හුව අරඹයි

සිංහල ජාතිවාදය හා දේශ ප්‍රේමය විකුණා දේශපාලනයේ පොරක් වීමට දඟලන විමල් වීරවංශට පාර්ලිමේන්තුවේ අලුත් සගයෙකු හමු වී ඇත. ඒ උදය ගම්මන්පිල නැමැත්තාය. පාර්ලිමේන්තුවට ගම්මන්පිල පැමිනි පළමු දිනයේදීම සිංහල ජාතිවාදය ඇවිස්සීම සඳහා ඔහු රට බෙදීමේ කථාවක් පාර්ලිමේන්තුවට ගෙනා ආවේය. හෙළ උරුමයේ පොරක් වී සිටි ගම්මන්පිල මහින්දගේ කර පිටින් මෙවර පාර්ලිමේන්තුවට තේරී පත් වුයේද ජාතිවාදය ගොදුරක් කර ගැනීම හරහාය.

මේ රට ජාතිවාදය නිසා විශාල වශයෙන් අගාධයට ඇද වැටුනු රටකි. ඒ සඳහා අති විශාල වන්දියක් මේ රටේ ජනතාව විසින් ගෙවා ඇත. නැවත වරක් ඒ අගාධයට රට ඇද දැමීම සඳහා ජාතිවාදී නරියන්ට ඉඩ නොදිය යුතුය. ඒ සඳහා ජාතිවාදයට එරෙහි ජන බලයක් ගොඩ නැගීම සඳහා පෙරමුණ ගන්නා ලෙස අපි ආයාචනය කර සිටිමු.

## The Committee for a Workers International

The Committee for a Workers' International (CWI) is the socialist international organization to which the United Socialist Party is affiliated.
The CWI is organized in 45 countries and Works to unite the Working class and oppressed peoples against global capitalism and to fight for a Socialist world.
For more details including CWI publications
Write to : CWI,PO.Box 3688,London E 111YE,
email:cwi@worldsoc.co.uk

**ඔබත් කූපනය පුරවා එවන්න**

එක්සත් සමාජවාදී පක්ෂය
ஐக்கிய சோசலிச கட்சி
UNITED SOCIALIST PARTY

නම ---------------------------
ලිපිනය ---------------------------
---------------------------
රැකියාව ---------------------------
දුරකථනය
එක්සත් සමාජවාදී පක්ෂය

එම් කේ පියරත්න වන මා විසින් 53/6 ඊ ඩී දාබරේ මාවත නාරාහේන්පිට පිහිටි සමාජ පොත් පියස මුද්‍රණාලයෙහිදී මුද්‍රණය කරන ලදී.